පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 118

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අට වැනි පාර්ලිමේන්තුව
(සිව්වන සැසි වාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවන වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින්

2020 පෙබරවාරි මස 18 වන දින ඉදිරිපත් කරන ලදී.

2020 පෙබරවාරි මස18වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව</u>
<u>අට වැනි පාර්ලිමේන්තුව (සිව්වන සැසි වාරය)</u>

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 (1) හි විධිවිධාන ප්‍රකාරව 2020 ජනවාරි මස 21 වැනි දින පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාව විසින් අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වන සැසිවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය පිළිබඳව ගත් තීරණය පරිදි 2020 පෙබරවාරි 05 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 16 දෙනා පත් කරන ලදී.

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., (සභාපති)
2. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම.,
3. ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා, පා.ම.
4. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
5. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
6. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.,
7. ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා, පා.ම.,
8. ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.,
9. ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා, පා.ම.,
10. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.,
11. ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.,
12. ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය, පා.ම.,
13. ගරු රන්ජන් රාමනායක මහතා, පා.ම.,
14. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.,
15. ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා, පා.ම.
16. ගරු ඩී.වී. චානක මහතා, පා.ම.,

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව</u>
<u>අට වැනි පාර්ලිමේන්තුව (තෙවන සැසි වාරය)</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අට වැනි පාර්ලිමේන්තුවේ තෙවන සැසිවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතාගේ සභාපතිත්වයෙන් යුතු පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 16 දෙනා ගෙන් සමන්විත විය.

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., (සභාපති)
2. ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.,
3. ගරු රවීන්ද්‍ර සමරවීර මහතා, පා.ම.,
4. ගරු සුජීව සේනසිංහ මහතා, පා.ම.,
5. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.,
6. ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.,
7. ගරු වසන්ත අලුවිහාරේ මහතා, පා.ම.,
8. ගරු රන්ජන් රාමනායක මහතා, පා.ම.,
9. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.,
10. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම.
11. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා, පා.ම.,
12. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා, පා.ම.,
13. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
14. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
15. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.,
16. ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා, පා.ම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
අට වැනි පාර්ලිමේන්තුව (දෙවන සැසි වාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අට වැනි පාර්ලිමේන්තුවේ දෙවන සැසිවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතාගේ සභාපතිත්වයෙන් යුතු පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 26දෙනා ගෙන් සමන්විත විය.

1. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, පා.ම., (සභාපති)**
2. ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.,
3. ගරු රවීන්ද්‍ර සමරවීර මහතා, පා.ම.,
4. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා, පා.ම.,
5. ගරු සුජීව සේනසිංහ මහතා, පා.ම.,
6. ගරු වසන්ත අලුවිහාරේ මහතා, පා.ම.,
7. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.,
8. ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.,
9. ගරු ලසන්ත අලගියවන්න මහතා, පා.ම.,
10. ගරු රන්ජන් රාමනායක මහතා, පා.ම.,
11. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.,
12. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා, පා.ම.,
13. ගරු අනුර දිසානායක මහතා, පා.ම.,
14. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා, පා.ම.,
15. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා, පා.ම.,
16. ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
17. ගරු බිමල් රත්නායක මහතා, පා.ම.,
18. ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා, පා.ම.,
19. ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා, පා.ම.,
20. ගරු ජයන්ත සමරවීර මහතා, පා.ම.,
21. ගරු එස්. ශ්‍රීතරන් මහතා, පා.ම.,
22. ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා, පා.ම.,
23. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.,
24. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා, පා.ම.,
25. ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම.,
26. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා, පා.ම.,

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

අට වැනි පාර්ලිමේන්තුව (පළමු සැසිවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අට වැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතාගේ සභාපතිත්වයෙන් යුතු පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 28දෙනා ගෙන් සමන්විත විය.

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (සභාපති)
2. ගරු රවුෆ් හකීම් මහතා
3. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
4. ගරු දයාසිරි ජයසේකර මහතා
5. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
6. ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
7. ගරු සුජීව සේනසිංහ මහතා (2016.07.07 දින පත් කරන ලදී)
8. ගරු වසන්ත අලුවිහාරේ මහතා
9. ගරු ලසන්ත අලගියවන්න මහතා
10. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
11. ගරු අජිත් පී. පෙරේරා මහතා
12. ගරු රන්ජන් රාමනායක මහතා
13. ගරු අශෝක් අබේසිංහ මහතා
14. ගරු අනුර දිසානායක මහතා
15. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
16. ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා (2016.05.17 දින පත් කරන ලදී)
17. ගරු බිමල් රත්නායක මහතා
18. ගරු වීරකුමාර දිසානායක මහතා
19. ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා
20. ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (2016.04.07 දින පත් කරන ලදී)
21. ගරු එස්. ශ්‍රීතරන් මහතා
22. ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
23. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
24. ගරු වේලු කුමාර් මහතා (2016.07.05 දින ඉල්ලා අස්වන ලදී)
25. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
26. ගරු ප්‍රසන්න රණතුංග මහතා (2016.04.07 දින පත් කරන ලදී - 2016.05.17 දින ඉල්ලා අස්වන ලදී)
27. ගරු හර්ෂණ රාජකරුණා මහතා
28. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

<u>පටුන</u>

පිටු අංක

සභාපතිතුමාගේ සටහන xi

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සිව්වන සැසිවාරයේ පළමුවන වාර්තාව xiii

ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව සහ ෆිනෑන්ස් පීඑල්සී……………………………3

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම………………………………17

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව…………………………………………29

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව………………………………………………35

විදේශ සේවා නියුක්ති කාර්යාංශය...…………………………………………..45

ශ්‍රී ලංකා මහ බැංකුව…………………………………………………………51

ලංකා විදුලිබල මණ්ඩලය……………………………………………………57

ජාතික ඉතිරිකිරීමේ බැංකුව…………………………………………………...67

මහජන බැංකුව…………………………………………………………………71

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය………………………………………81

සභාපතිතුමාගේ සටහන

2020 ජනවාරි මස 03 වන දින ආරම්භ කරන ලද අටවන පාර්ලිමේන්තුවේ හතරවන සැසිවාරය සඳහා පත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් 2020 පෙබරවාරි මස 07 වන දින පැවති එහි පළමු රැස්වීමේදී නැවතත් මා පත් කර ගැනීම පිළිබඳ ස්තූතිවන්ත වන අතර එකී සැසිවාරය තුළ ඉදිරිපත් කරනු ලබන පළමු වාර්තාව ලෙස මෙම වාර්තාව අද දින (2020 පෙබරවාරි මස 18) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ සතුටු වෙමි.

මෙම වාර්තාව සඳහා ආයතන දහයක (10) ක්‍රියාකාරම් පිළිබඳ කාරක සභාව විසින් කරන ලද නිරීක්ෂණ පිළිබඳ කරුණු ඇතුළත් වන අතර එහි විශේෂයෙන් ජනතා අවධානයට යොමු වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ හා ලංකා විදුලි බල මණ්ඩලයේ ක්‍රියාකාරකම් පිළිබඳව නිරීක්ෂණ ඇතුළත් වී ඇත.

2015 නොවැම්බර් මස 15 දින මා ප්‍රථම වරට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගත් දින සිට අටවන (8)වන පාර්ලිමේන්තුවේ සැසිවාර හතර (4) තුල වාර්තා එකොළහක් (11) පාර්ලිමේන්තුවට ඉදිපත් කිරීමට හැකි විය. ඒ අතුරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතුව, සහල් ආනයනය, ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ ගුවන්යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම හා ගුවන් යනා 8ක් අත්පත් කර ගැනීම සඳහා එළඹ තිබූ ගිවිසුම අවලංගු කිරීම හා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය පිළිබඳව විශේෂ වාර්තා 04 ක් ඉදිරිපත් කිරීමට හැකිවිය.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කටයුතු සජීව්ව විකාශනය කිරීම සඳහා මාධ්‍යයට ඉඩහසර ලබා දීමෙන් පසු කාරක සභාවේ නිරීක්ෂණ කටයුතු පිළිබඳ මහජනයා දැනුවත් කිරීමට වඩාත් පුළුල් අවස්ථාවක් විවර වූ අතර කාරක සභාව විසින් අදාල රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරකම් පිළිබඳව සිදු කරන ලද සියලු නිරීක්ෂණ සම්පිණ්ඩනය කොට නිගමන හා අදාල නිර්දේශද සමග වාර්තාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම මගින් රාජ්‍ය ආයතනවල මූල්‍ය විනය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා බලධාරීන්ගේ අවධානය යොමු කිරීමට අවස්ථාවක් සැලසෙන අතර එකී කාර්යයන් නිසි අයුරින් නියාමනය කිරීම මගින් මෙරට ආර්ථිකයේ අභිවෘද්ධිය සඳහා මහත් දායකත්වයක් ඇති වනු ඇති බව මාගේ විශ්වාසයයි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයට හා කාරක සභාවේ නිරීක්ෂණ කටයුතු සඳහා සහයෝගය ලබා දුන් පාර්ලිමේන්තුවේ අදාල සියලු කාර්ය මණ්ඩල සමාජික සමාජිකාවන්ට කාරක සභාව වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පුද කරන අතර විගණකාධිපති සහ ඔහුගේ කාර්ය මණ්ඩලය, පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ඔහුගේ කාර්ය මණ්ඩලය, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ඔහුගේ කාර්ය මණ්ඩලයද කාරක සභාවේ නිරීක්ෂණ කටයුතු සඳහා දෙන ලද සහයෝගය වෙනුවෙන් මාගේ ප්‍රසාදය පළ කරමි.

සුනිල් හඳුන්නෙත්ති පා.ම.
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වන සැසි වාරය
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ
පළමුවන වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි අටවැනි පාර්ලිමේන්තුව සිව්වන සැසිවාරයේ පළමුවන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ඇතුලුව, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යටතේ පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

ඒ අනුව, අට වැනි පාර්ලිමේන්තුවේ තෙවන සැසිවාරයේ දී කමිටුවේ විමර්ශනයට ලක්වූ පහත සඳහන් ආයතන 10ට අදාල නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතන හා විමර්ශනයට ලක් කරන ලද කාල සීමාවන්</u>

	ආයතනය	විමර්ශනය කරන ලද දිනය	විමර්ශනයට ලක් කරන ලද කාල සීමාව/කරුණු
1	ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව සහ ෆිනෑන්ස් පීඑල්සී	2019.02.20	වර්තමාන කාර්ය සාධනය
2	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම	2019.02.22	2015 හා 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්ය සාධනය
		2019.05.08	2019.02.22 දින කාරක සභාවේදී සාකච්ඡා කරන ලද කරුණුවල වර්තමාන තත්ත්වය නිරීක්ෂණය කිරීම
3	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	2019.03.07	2015 හා 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්ය සාධනය
4	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	2019.03.08	2014, 2015 හා 2016 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය
5	විදේශ සේවා නියුක්ති කාර්යාංශය	2019.03.15	2015 හා 2016 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය
6	ශ්‍රී ලංකා මහ බැංකුව	2019.03.22	2014, 2015 හා 2016 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය
7	ලංකා විදුලිබල මණ්ඩලය	2019.08.23 2019.10.08	2016 හා 2017 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය

8	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	2019.09.04	2016 හා 2017 වර්ෂයන්හි විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්ය සාධනය
9	මහජන බැංකුව	2019.09.05	2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සහ වර්තමාන කාර්ය සාධනය
10	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය	2019.07.10	2015 හා 2016 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්ය සාධනය

.

<u>ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව</u>

<u>(මුදල් අමාත්‍යාංශය)</u>

(2019.12.10 දින සිට මෙම ආයතනය මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 පෙබරවාරි මස 20 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

ආයතනයේ ප්‍රසම්පාදන කටයුතුවලදී, ජාතික ප්‍රසම්පාදන ඒජන්සිය මගින් නිකුත් කරන ලද ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අදාල චක්‍රලේඛ අනුගමනය කරන්නේද යන්නත් ඒ අනුව සකස් කර අනුමත කර ගන්නා ලද ප්‍රසම්පාදන සැලැස්මක් තිබේද යන්නත් පිළිබඳව විමසීම.

<u>නිර්දේශ</u>

සකස් කරන ලද ප්‍රසම්පාදන මාර්ගසූවක **(Procurement Guidelines)** සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය අනිවාර්යයෙන් ලබා ගත යුතු බව අවධාරණය කළ කාරක සභාව පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් සතියක් ඇතුළත විගණකාධිපති සහ කාරක සභාව වෙත ලබා දෙන ලෙස අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ කිරීම.

i. ඉහත ප්‍රසම්පාදන මාර්ගසූවක සහ ප්‍රසම්පාදන සැලසුමෙහි පිටතක්
ii. එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දිනය, අනුගමනය කිරීම ආරම්භ කරන ලද දිනය සහ අනුමැතිය සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත යවන ලද ලිපිය.
iii. ප්‍රසම්පාදන මාර්ගසූවක සකස් කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතව ක්‍රියාත්මක කරන ලද අභ්‍යන්තර ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය සහ එකී ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කරන ලද කාල සීමාව.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරීගේ 2019.02.27 දිනැති ලිපිය මගින් ඉහත සියලු වාර්තා කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

02. <u>කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම</u>

රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස මෙම ආයතනය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලය අනුමත කර ගන්නා ලද්දේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම.

<u>නිර්දේශ</u>

කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට අදාළ චක්‍රලේඛ සහ එම චක්‍රලේඛ මෙම ආයතනයට යැවූ දින වකවානු පිලිබඳ වාර්තාවක් කාරක සභාව වෙත එවන මෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට නිර්දේශ කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

03. <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

2016, 2017, 2018, 2019 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද්දේද යන්න පිළිබඳව කරුණු විමසීම.

එක් වසරක් සඳහා අය වැය සකස් කිරීමෙන් පසුව අදාල ඉලක්ක තීරණය කරනු ලබන බවත් ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලබන බවත් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩය අනුමැතිය ලබා දී තිබෙන බවත් වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි පැවසීය.

2018 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් කරන ලද දැනුම්දීම අනුව ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ලේඛනය ක්‍රියාකාරී සැලැස්මක් ලෙස පිළිගත නොහැකි බව පෙන්වා දුන් කාරක සභාව මේ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ අවධානය යොමු කරමින් භාණ්ඩාගාරයේ අධීක්ෂණයේ මදකම පෙන්වා දෙන ලදී.

<u>නිර්දේශ</u>

භාණ්ඩාගාර නියෝජිතයෙකු මෙම ආයතනයට අනුයුක්ත කිරීමේ අවශ්‍යතාව කාරක සභාව අවධාරණය කළ අතර, ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

04. <u>එම්.බී.එස්.එල්. රක්ෂණ සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම</u>

එම්.බී.එස්.එල්. බැංකුව යටතේ උප සමාගමක් ලෙස පවතින එම්.බී.එස්.එල්. රක්ෂණ සමාගමෙහි ක්‍රියාකාරිත්වයෙහි බලපත්‍රය අවලංගු කර තිබීම.

මෙහිදී ආයතනයේ සභාපති විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ;

- මෙය ඒ.බී.සී. රක්ෂණ සමාගම ලෙස පැවති බවත්,

- 2009 වසරේදී එම්.බී.එස්.එල්. බැංකුව යටතට ගත් බවත්,
- 2017 වසරේදී ප්‍රාග්ධනය නොමැතිකම හේතුවෙන් බලපත්‍රය අවලංගු කරන ලද බවත්,
- ඉන් අනතුරුව ප්‍රාග්ධනය සපයා ගැනීම පිණිස මිල ගණන් කැඳවා අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව උපායමාර්ගික සහකරුවකු ලෙස යුනයිටඩ් කැපිටල් හෝල්ඩින්ස් ආයතනය තෝරා ගන්නා ලද බවත්,
- ඔවුන් සමග ආයෝජන ගිවිසුම අත්සන් කර තිබෙන බවත්,
- සම්පූර්ණ ආයෝජනය වන රුපියල් මිලියන 1200න් ඔවුන්ගේ ආයෝජනය රුපියල් මිලියන 700ක් බවත්,
- මේ වන විට එයින් රුපියල් මිලියන 500ක් ලබා දී තිබෙන බවත් ඉතිරි රුපියල් මිලියන 200 ලබා දීම සඳහා 2019 පෙබරවාරි මස 22 දින තෙක් කල් ලබා දී තිබෙන බවත් ය.

<u>නිර්දේශ</u>

අමතර ප්‍රාග්ධනය සපයා ගැනීම පිණිස සිදු කරන ලද මෙම උපායමාර්ගික ක්‍රියාවලිය පිළිබඳ සියලු අනුමැතීන් සහ එම ක්‍රියාවලියට අදාල සියලු ලිපි ලේඛන සහ තොරතුරු සතියක් තුලදී කාරක සභාවට සහ විගණකාධිපති වෙත යොමු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරීගේ 2019.02.27 දිනැති ලිපිය මගින් ඉහත සියලු වාර්තා කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

05. <u>ආයතනයේ ලාභ අලාභ තත්ත්වය</u>

ආයතනය විසින් 2014 සහ 2015 වර්ෂයන්හිදී රුපියල් මිලියන 30.67ක සහ රුපියල් මිලියන 78.30ක පාඩුවක් ලබා තිබෙන බවත්, 2016 සහ 2017 වර්ෂයන්හිදී පිළිවෙලින් රුපියල් මිලියන 78.65ක සහ රුපියල් මිලියන 100.85ක ලාභයක් ලබා තිබෙන බවත් 2018 වසරේදී ලාභය අඩුවී තිබෙන බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

ආයතනයේ සභාපති විසින් මෙම කරුණ පිළිබඳව පහත අදහස් දක්වන ලදී.

- ආයතනයේ එවකට සිටි ප්‍රධාන විධායක නිලධාරි විසින් සිදු කරන ලද අයථා ගනුදෙනු කිහිපයක් හේතුවෙන් සහ රක්ෂණය සඳහා මුදල් යෙදවීම හේතුවෙන් ලාභය අඩුවූ බව
- 2019 වසරේදී රුපියල් මිලියන 594ක ලාභයක් අපේක්ෂා කරන බව
- මේ වන විට ප්‍රධාන විධායක නිලධාරිගේ වැඩ තහනම් කර තිබෙන බව
- මෙම ගනුදෙනු සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වාගෙන යනු ලබන බව

නිර්දේශ

එවකට ප්‍රධාන විධායක නිලධාරී විසින් සිදු කර තිබෙන මූල්‍ය වංචා සම්බන්ධ තොරතුරු සහ ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රය ඇතුලත් වාර්තාවක් සතියක් තුලදී කාරක සභාවට ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

06. වික්ටෝරියා ගොඩනැගිල්ලේ දේපල

මූල්‍ය වාර්තා අනුව සාධාරණ අගය රුපියල් මිලියන 75ක වටිනාකමකින් යුතු වන ඕල්කට් මාවතේ පිහිටි වික්ටෝරියා ගොඩනැගිල්ලේ දේපල රුපියල් මිලියන 36.5කට විකුණා ඇති බවත් තක්සේරුකරුගේ මූල්‍ය වාර්තා අනුව දේපලවල වෙළඳපල වටිනාකම රුපියල් 4,344,288/-ක් වන බවත් කාරක සභාවේ අවධානයට යොමු විය.

මෙම ගොඩනැගිල්ල මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බවත් මෙහිදී විකුණා ඇත්තේ ආයතනය වෙත උකස් කරන ලද කල්බදු අයිතිය බවත් මෙමගින් ණය මුදල පියවා ගෙන තිබෙන බවත් සම්පූර්ණ හිඟහිටි මුදල රුපියල් මිලියන 9.9ක් බවත් රුපියල් මිලියන 36කට මෙම කල්බදු අයිතිය විකුණන ලද බවත් කල්බදු අයිතිය තව වසර 11ක් ඉතිරිව පැවතුන බවත් වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි විසින් පවසන ලදී.

නිර්දේශ

මෙහි පොත් අගය රුපියල් මිලියන 75ක් ලෙස දක්වා තිබෙන බවත් එය නිවැරදි නම් රුපියල් මිලියන 36කට විකිණීමෙන් පාඩුවක් සිදුවන බවත් පෙන්වා දුන් කාරක සභාව මෙම තොරතුරු අපැහැදිලි බැවින් මේ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සතියක් තුලදී ලබා දෙන ලෙස ආයතන සභාපති වෙත නිර්දේශ කරන ලදී.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

07. තලවතුගොඩ, මාදිවෙල පිහිටි දේපල

තලවතුගොඩ, මාදිවෙල පිහිටි දේපලක් අයිතිකරුට මාරු කර ණය මුදලේ හිඟහිටි ශේෂයේ සම්පූර්ණ හා අවසාන පියවීම ලෙස එකඟතාවයෙන් රුපියල් මිලියන 6.5ක් ලබා ගෙන තිබෙන බවත් මූල්‍ය ප්‍රකාශන අනුව එහි සාධාරණ අගය රුපියල් මිලියන 14.727ක් ලෙස සටහන්ව තිබෙන බවත් පෙන්වා දුන් කාරක සභාව මෙම ණය මුදල සම්බන්ධයෙන් වූ එකඟතාවය පිළිබඳව කරුණු විමසීම.

මෙහිදී කළමනාකරු (නීති) විසින් පහත අදහස් දක්වන ලදී.

- මෙය රුපියල් මිලියන 15ක ණය මුදලක් බව
- ඔවුන් මෙම ණය මුදල ගෙවීම ප්‍රමාද කරන ලද බව
- ඔවුන්ගේ ඉල්ලීම මත දේපල ආයතනයට පවරා ගනු ලැබූ බව
- එසේ පවරන ලද අවස්ථාවේදී ණය මුදලේ ඒ වන විට ගෙවීමට තිබුණු හිඟ මුදල පියවන ලද බව
- ගෙවීමට තවත් කොටසක් තිබුණු බව හා ඉන්පසු එම ඉතිරි ණය මුදල නොගෙවා පැහැර හරින ලද බව
- ඒ වන විට ඔවුන් එම දේපලෙහි රැඳී සිටීම හේතුවෙන් දේපල සම්පූර්ණයෙන් අත්පත් කර ගැනීමට ඔවුන් ඉවත් කිරීම පිණිස නඩු පවරන ලද බව
- එහිදී ඉතිරි කොටස ගෙවා ණය මුදල පියවීමට සමථයකට පැමිණි බව
- එයට පොලියෙන් කොටසක් අයත් බව

<u>නිර්දේශ</u>

පහත වාර්තා සතියක් තුළදී කාරක සභාවට ඉදිරිපත් කිරීම.

i. මෙම කරුණ සම්බන්ධව තීරණ ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල කාර්ය සටහන්

ii. නිසි පරිදි ගණනය කරන ලද පොළිය ඇතුළත් වාර්තාවක්

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. මෙම වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ii. මෙම කරුණ සම්බන්ධව ආයතනය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාරාංශ සටහන **ඇමුණුම 01** වේ.

08. <u>අක්‍රිය සේවක ණය</u>

2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 7.86ක් වූ අක්‍රිය සේවක ණය 15ක් තිබෙන බවත් එයින් රුපියල් මිලියන 7.144ක් සේවකයන් හතර දෙනෙකුගෙන් ලැබිය යුතු බවත් පෙන්වා දුන් කාරක සභාව ඒ පිළිබඳ කරුණු විමසීම.

මෙහිදී අනාවරණය වූයේ,

- ආයතනයේ සාමාජිකයන් සඳහා රජයේ ණය, වාහන ණය පහසුකම් සලසාදී තිබෙන බවත්
- මෙම ණය මුදලින් සමහර අයගේ හිඟ මුදල ඉතා කුඩා අගයක් වන බවත්
- මෙයින් හතර දෙනෙකුගේ ණය ප්‍රමාණයන් පමණක් විශාල අගයක් වන බවත්
- ඔවුන්ගේ වාහන උකස් කර මෙම ණය මුදල ලබා ගෙන තිබෙන බවත්
- ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ගයන් ආරම්භ කර තිබෙන බවත්

- මේ වන විට ඔවුන් සියලු දෙනාම සේවයෙන් ඉවත්වී ඇති බවත් ය.

<u>නිර්දේශ</u>

ණය නොගෙවා නතර වූයේ කෙදිනකද යන්න සහ ඉන්පසු ගන්නා ලද ක්‍රියා මාර්ගයන් කවරේද යන්න පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් සතියක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මෙම වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

09. <u>සේවක වැටුප් ගෙවීම</u>

ආයතනයේ සේවක වැටුප් ගෙවීම සඳහා පෞද්ගලික ආයතනයක් සම්බන්ධ කර ගන්නා ලද්දේද යන්න සහ එම කාල වකවානුව පිළිබඳවත් එය තෝරා ගත් ආකාරය පිළිබඳවත් එම ගිවිසුම පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම කරුණ සම්බන්ධව අදහස් දැක් වූ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි විසින් පවසන ලද්දේ;

- මෙය එස්.එස්.පී. කෝපරේට්ස් නම් වූ ආයතනයක් බවත්
- 2015 ජූලි මස සිට වැටුප් ගෙවීම සඳහා සම්බන්ධ කර ගන්නා ලද බවත්
- 2015 වසරේදී මර්චන්ට් බැංකුවත් තවත් උප ආයතන දෙකක් ඒකාබද්ධවීමක් සිදු වූ බවත්
- එහි එක් ආයතනයක් වූ මර්චන්ට් ක්‍රෙඩිට් ආයතනය විසින් එස්.එස්.පී. කෝපරේට්ස් ආයතනය සමග වූ ගිවිසුම අනුව එය පවත්වා ගෙන යන ලද බවත්
- ඉන් පසුව නව ගිවිසුමකට එළඹි බවත් ය.

එසේ ආයතන තුනක් ඒකාබද්ධ කිරීමේදී එහි එක් ආයතනයක් විසින් එළඹ තිබෙන ගිවිසුමක් පදනම් කර ගනිමින් ඉතිරි ආයතන දෙකෙහි කටයුතු සිදු කිරීම වලංගු නොවන බව පෙන්වා දුන් කාරක සභාව, සේවක වැටුප් ගෙවීමේදී සිදුවී තිබෙන වැඩිපුර වැටුප් ගෙවීම පිළිබඳ තවදුරටත් කරුණු විමසීය.

එහිදී වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි විසින් පහත අදහස් දක්වන ලදී.

- රුපියල් මිලියන 37.1ක වැඩිපුර සේවක වැටුප් ගෙවීමක් සිදුව තිබෙන බව
- එය එස්.එස්.පී. කෝපරේට්ස් ආයතනයේ සේවකයකු විසින් සිදු කරන ලද වංචාවක් හේතුවෙන් සිදුවී තිබෙන බව

- මෙම තැනැත්තාට විරුද්ධව අපරාධ විමර්ශන පරීක්ෂණයක් පවත්වාගෙන යන බව
- මසකට රුපියල් මිලියන 1.8ක් ඉහත ආයතනයෙන් අය කර ගන්නා බව
- ඒ අනුව මේ වන විට රුපියල් මිලියන 23.1ක මුදලක් ඉහත ආයතනයෙන් අය කර ගෙන තිබෙන බව

<u>නිර්දේශ</u>

E & Y විගණන ආයතනය මේ පිලිබඳ පරීක්ෂණයක් සිදු කර තිබෙන බවත් වැටුප් වැඩිපුර ගෙවීම එස්.එස්.පී. කෝපරේට්ස් ආයතනයේ දෝෂයක් ලෙස දක්වා තිබුණද මෙම ආයතනයේ දෝෂයක් නොමැති බව එයින් පැවසිය නොහැකි බවත් වරද පිළිගත් පසු කොටස් වශයෙන් ගෙවීම අනුමත කළ නොහැකි බවත් පෙන්වා දුන් කාරක සභාව, පහත නිර්දේශ ලබා දෙන ලදී.

i. මෙම සිදුවීම සහ අනුගමනය කරන ලද ක්‍රියා පිළිවෙල පිළිබඳ අමාත්‍යාංශ මට්ටමෙන් පරීක්ෂණයක් සිදු කිරීම.
ii. විගණකාධිපති විසින් වෙනම පරීක්ෂණයක් සිදු කිරීම.
iii. වහාම මෙම ආයතනය සමග ගනුදෙනු කිරීම නතර කිරීමට ක්‍රමයක් සකස් කර ගැනීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. ඉහත නිර්දේශ අංක (i) හා (ii) සඳහා වර්තමාන ප්‍රගතිය වාර්තා කර නොමැත.
ii. ආයතන මට්ටමින් මේ සම්බන්ධව සකස් කරන ලද වාර්තාව කාරක සභාව ඉදිරිපත් කර ඇත.

10. <u>වත්තල, හැඳල ඉඩම</u>

වසර 20ක පමණ කාලයක සිට බැංකුවට අයත්ව තිබූ හැඳල, වත්තල පිහිටි ඉඩමක් විකුණන ලද්දේද යන්නත් එසේ විකුණන ලද්දේ කුමන හේතුවක් නිසාද යන්නත් විමසීම.

- මෙයද ණය මුදලක් නොගෙවීම හේතුවෙන් 1994 වකවානුවේදී අත්පත් කර ගන්නා ලද දේපලක් බවත්,
- ආදායමක් නොමැති බැවින් ණය මුදල බේරා ගැනීම සඳහා විකිණීමට තීරණය කරන ලද බවත්,
- මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය තිබෙන බවත්,
- මේ සඳහා දෙවරක් දැන්වීම් පල කරන ලද බවත්,

- පළමුවර මිල ගණන් පිළිබඳ සෑහීමකට පත් නොවූ නිසා නැවත වරක් දැන්වීම් පල කර මිල ගණන් කැඳවූ බවත්, වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී විසින් සඳහන් කරන ලදි.

තවද, අනාවරණය වූ පහත කරුණු සම්බන්ධව කාරක සභාවේ වැඩිදුර අවධානය යොමු විය.

- 2018 අගෝස්තු 07 දින අගය කිරීම් වාර්තාව අනුව, මෙම දේපලෙහි වටිනාකම රුපියල් මිලියන 98.25ක් වුවද, එය විකුණා ඇත්තේ ඊට අඩු අගයක් වූ රුපියල් මිලියන 94.297කට බව
- වත්තල, හැඳල ඉඩම විකුණා මසකට ලක්ෂ 3 බැගින් වූ කුලියකට සියඹලාපෙ ඉඩමක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව
- හැඳල ඉඩම විකිණීමේදී ගැනුම්කරුගෙන් රුපියල් මිලියන 30ක් ලබා ගත් අතර ඉතිරි රුපියල් මිලියන 64ක මුදල, මාස 12ක කාලසීමාවකට 17.5%ක පොලියට පහසු ගෙවීමේ ක්‍රමයට දේපල ණය මුදලක් ලෙස ලබා දී ඇති බව

මෙහිදී වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි විසින් වැඩිදුර අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ,

- මෙම සම්පූර්ණ ඉඩම පර්චස් 62.7ක් බවත්
- එයින් පර්චස් 5.5ක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගෙන තිබෙන බවත්
- ඉතිරි ප්‍රමාණය විකුණන ලද බවත්
- විකුණුම් මිල රුපියල් මිලියන 94.2ක් වූ බවත්
- ඒ අනුව විකුණන ලද ඉඩම් ප්‍රමාණය සැලකීමේදී ලාභයක් ලැබී තිබෙන බවත්
- පවරා ගනු ලැබූ කොටස සඳහා රුපියල් මිලියන 4.9ක වන්දියක් ලැබීම සඳහා අනුමැතිය ලැබී තිබෙන බවත්
- අල්ලා ගනු ලබන වාහන ගාල් කරනු ලබන අංගනයක් ලෙස මෙම වත්තල ඉඩම භාවිතා කරන ලද බවත්
- තවත් ඉඩමක් ඒකල තිබෙන බවත්
- ආයතනයේ ව්‍යාපාරවලින් 65%ක් කල්බදු ව්‍යාපාර බැවින් තවත් ඉඩමක් කුලියට ගන්නා ලද බව හා එය මෝටර් රථ අලෙවි මධ්‍යස්ථානයක් ලෙසද භාවිතා කිරීමටද අපේක්ෂිත බවත්
- වත්තල, හැඳල ඉඩම විකුණා ඉඩමක් ලබා ගැනීම සඳහා දැන්වීමක් පල කරනු ලැබූ බවත්, සමහර ඉඩම් සුදුසු නොවූ අතර මාර්ගයට දුරින් පිහිටා තිබුනු බවත් සියඹලාපෙ ඉඩම ප්‍රධාන මාර්ගයේ පිහිටා තිබෙන බවත්
- හැඳල ඉඩම විකුණා ගත් මුදල, ණය මුදලක් ලෙස ලබා දී ඇත්තේ ඉහළ පොලී අනුපාතයකට බවත්
- ඒ සඳහා වෙනම රුපියල් මිලියන 11ක පොලියක් ලැබුණු බවත්

- මෙම මුදල් ගෙවා අවසන් වීමෙන් පසුව පමණක් ඔප්පුව හරවා තිබෙන බවත් ය.

<u>නිර්දේශ</u>

මේ පිළිබඳව වූ පහත සඳහන් ලිපි ලේඛන කාරක සභාවට සතියක් ඇතුළත ලබා දීම.

i. වත්තල, හැඳල ඉඩම විකිණීම සඳහා ස්ථාපනය කරන ලද ප්‍රසම්පාදන කමිටුවෙහි කාර්ය සටහන්.
ii. මෙම ඉඩම විකිණීම සඳහා අගෝස්තු මස 17 වැනි දින කරන ලද දැන්වීම අනුව ලැබුණු ලංසු පිළිබඳව සහ ඊට අදාලව කමිටුවෙහි නිර්දේශය.
iii. සැප්තැම්බර් මස පවත්වන ලද දෙවන කමිටුව විසින් සලකා බලන ලද **(referred)** කාර්ය සටහන්, දැන්වීම අනුව ලැබුණු ලංසු සහ තෝරා ගැනීම පිළිබඳව එම කමිටුවෙහි කාර්ය සටහන්, කමිටු නිර්දේශය සහ ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය.
iv. සියඹලාපෙ ඉඩම ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවෙහි කාර්ය සටහන් සහ ලැබුණු ලංසු අතුරෙන් එක් අයෙක් තෝරා ගත් ආකාරය.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුවේ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරීගේ 2019.02.27 දිනැති ලිපිය මගින් ඉහත සියලු වාර්තා කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

11. <u>සේවකයින්ට එදිරි විමර්ශන</u>

හිටපු ප්‍රධාන විධායක නිලධාරි ඇතුලුව තවත් සේවකයන් හය දෙනෙකුට විරුද්ධව පවතින චෝදනා කවරේද යන්නත්, ඊට අදාළව විමර්ශන සිදු කර තිබේද යන්නත් ඔවුන්ගේ වැඩ තහනම් කර තිබෙන්නේද යන්නත් විමසීම.

මෙහිදී ආයතනයේ සභාපති විසින් පහත අදහස් ඉදිරිපත් කරන ලදි.

- ඔවුන් සියල්ලන්ම දූෂණ වංචාවලට සම්බන්ධ වූවන් බවත්
- ඔවුන්ගේ වැඩ තහනම් කර තිබෙන බවත්
- ඒ පිළිබඳ සියලු තොරතුරු ජාතික විගණන කාර්යාලය වෙත ලබා දී තිබෙන බවත්
- වැඩ තහනමට ලක් කරන ලද ප්‍රධාන විධායක නිලධාරි විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව, කාර්ය මණ්ඩල රක්ෂණය පෞද්ගලික ආයතනයක් වන ජනශක්ති රක්ෂණ සමාගමට ලබා දීම, ශාඛා නවීකරණය සඳහා තම හිතවත් ගෘහනිර්මාණ ශිල්පියෙකු පත්

කිරීම, තෙවැනි පාර්ශ්වයන් සමග ගිවිසුම් සඳහා එළඹීම යනාදී කටයුතු සිදු කර තිබෙන බවත්.

තවද, ප්‍රධාන විධායක නිලධාරි ඩී.එම්.එන්. අරුණාපාල මහතාගේ සේවය අත්හිටුවීම සම්බන්ධයෙන් වූ 545 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහභාගීවී නොමැති බවත්, අධ්‍යක්ෂ මණ්ඩලය ගනු ලබන තීරණ සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු වන අතර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් යන තනතුරු දෙකම එක් පුද්ගලයකු විසින් දැරීම යහපාලන භාවිතයක් නොවන බවත් කාරක සභාව පෙන්වා දුන්නාය.

ශ්‍රී ලංකා මහ බැංකුවද මේ පිළිබඳව සිය අවධානය යොමු කර තිබෙන අතර මීලඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු පත් කිරීම සම්බන්ධයෙන් තීරණය කරන බව සභාපති විසින් පවසන ලදී.

12. අක්‍රිය ණය අනුපාතය (Non-Performing Loan Rate)

මෙම ආයතනයේ අක්‍රිය ණය අනුපාතය 11%ක් වන බව පෙන්වා දුන් කාරක සභාව සාමාන්‍යයෙන් වෙළඳපල පවතින අක්‍රිය ණය අනුපාතය කුමක්ද යන්න පිළිබඳව විමසීම.

මෙහිදී අදහස් දක්වමින් වැඩබලන ප්‍රධාන විධායක නිලධාරි පවසන ලද්දේ,

- මූල්‍ය ආයතනයක අක්‍රිය ණය අනුපාතය සාමාන්‍යයෙන් 8%ක් පමණ වන බවත්,
- මෙම මූල්‍ය සමාගමෙහි අක්‍රිය ණය අනුපාතය ඉහළ ගොස් ඇත්තේ කන්ටේනර් රථ, ටිපර් රථ, බස් රථ වැනි වාණිජ වාහන සඳහා කල් බදු ණය පහසුකම් ලබා දීම හේතුවෙන් ඒවායේ නැවත ගෙවීම් අපහසුවීම හේතුවෙන් වන බවත්
- දැන් එය යථා තත්වයට ගෙන ඒමට පියවර ගෙන තිබෙන බවත් ය.

නිර්දේශ

කාල රාමුව වසර 10ට වඩා වැඩි, වසර 5ට වඩා වැඩි අක්‍රිය ණය පවතින පුද්ගලයන් පිළිබඳවත්, ඔවුන්ගේ මූර්ත සුරකුම් අගය **(real security value)** පිළිබඳවත්, දැනට පවතින අක්‍රිය ණය අනුපාතය සහ ලබාදී තිබෙන ණය සඳහා වූ ණය පහසුකම් සංඛ්‍යාව **(number of facilities)** පිළිබඳ වාර්තාවක් සතියක් ඇතුළත කාරක සභාව වෙත ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

13. ප්‍රාග්ධන ප්‍රමාණවත්බව අනුපාතය (Capital Adequacy Ratio)

ආයතනයේ ප්‍රාග්ධන ප්‍රමාණවත්බව අනුපාතය, සම්මත මට්ටමට වඩා අඩුවෙන් පවතින බව පෙන්වා දුන් කාරක සභාව එය වර්ධනය කර ගැනීම සඳහා තිබෙන අනාගත සැලසුම් පිළිබඳ අවධානය යොමු කරන ලදී.

ආයතන සභාපති විසින් මෙහිදී පහත අදහස් දක්වන ලදී.

- MBSL රක්ෂණය නැවත ආයෝජනය කර ප්‍රතිවර්තනය (**reversal**) මගින් රුපියල් මිලියන 150ක පමණ ප්‍රමාණයක් ප්‍රාග්ධනයට ලැබෙන බව
- 2019 වසරේ රුපියල් මිලියන 500ක පමණ ලාභයක් අපේක්ෂා කරන බව
- එහි රඳවා ගැනීමේ ඉපැයුම් වලින් ඉතිරි මුදල ලබා ගැනීමට අපේක්ෂා කරන බව
- මීට අමතරව කොටස් නිකුතුවක් / ණයකර නිකුතුවක් සිදු කිරීම වැනි විකල්පයන් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා කරමින් පවතින බව

ඇමුණුම 01

FACT SHEET

BILL DISCOUNTING FACILITY GRANTED TO MR. H.L. FRANCIS

- MBSL has granted a Bill Discounting facility of LKR 15Mn to Mr. H.L. Francis (customer) by the **Offer Letter dated 24th February 1994** and the same was secured by ,
  1. Pledge over public quoted company shares amounting to LKR 16Mn
  2. LKR 7.8 Mn worth of shares purchased under proposed facility
  3. Primary mortgage over properties at:
     a) No. 300/8, Thalawathugoda Road, Madiwela (FSV of LKR 3.5Mn as at 13th December 1994)
     b) Batakettara Road, Kesbewa - Lots 1 & 2 of Plan No. 320 (FSV of LKR 1.6Mn as at 14th February 1994)

- Accordingly, **Mortgage Bond bearing No. 224 dated 01st March 1994 attested by A.M.A. Attanayake NP** was executed in favour of MBSL by the customer mortgaging the aforesaid immovable properties.

- Subsequently, upon the request of the customer, MBSL decided to purchase the mortgaged property situated at Madiwela for LKR 5.1Mn in full settlement of the interest outstanding amounting to LKR 4,313,653.12, regularization charges amounting to LKR 590,054.83, and in part settlement of the outstanding capital sum on the bills discounted under this facility, subject to the conditions in the **Amended Offer Letter dated 27th December 1995**.

- Accordingly, the Deed of **Transfer bearing No. 164 dated 27th December 1995 attested by K.J Cecil Perera NP** was executed by the customer in the name of MBSL. Thereafter the said property situated at Madiwela was released from the operation of the said Mortgage Bond bearing No. 224. Subsequent to the said Deed of Transfer bearing No. 164, the **Agreement to Sell bearing No. 165 attested by K.J Cecil Perera NP** was executed between the parties on the same date stipulating the agreement of MBSL to re-transfer the said property to the customer for a consideration of LKR 5.1Mn together with the interest payable at the rate of 24% per annum within a period of 2 ½ years ending on 30th June 1998. The possession of the property was held with a third party who was occupying the property under the customer.

- Therefore, from 27th December 1995 onwards, the customer continued to utilize the aforesaid Bill Discounting facility against the security of the Mortgage over the property situated at Batakettara.

- The customer also had defaulted re-payment to MBSL upon Bills discounted for the amount of LKR 7.5Mn and LKR 1,467,633.19 (Bills of Exchange Nos. 35730 and 35731 respectively) and MBSL had filed the Case bearing No. HC Civil 41/2004 (1) in the Commercial High Court of Colombo for recovering the said moneys, which are not secured by the aforesaid Mortgage

Bond No. 224. The said case was decided ex-parte entering the Decree dated 12th October 2004 in favour of MBSL.

- Since the customer had defaulted re-payment upon the Bill discounted to the value of LKR 7.5 Mn (Bill of Exchange No. 35729), MBSL filed legal action against the customer by the Case bearing No. HC Civil 40/2004 (1) in the Commercial High Court of Colombo for enforcing the aforesaid Mortgage Bond No. 224 for recovering a sum of LKR 7.5 Mn together with interest thereon at the rate of 25% per annum from 13th February 1996. The said case was decided ex-parte and the judgement was delivered in favour of the customer on 15th January 2005. When the matter was fixed for auction with regard to the mortgaged property, the customer arrived at a settlement for settling his dues towards MBSL.

- After a payment of LKR 4.5 Mn in 2007 to MBSL settling the dues pertaining to the three Bills aforesaid, the said Mortgage Bond No. 224 was discharged.

- Since the customer failed to comply with the said Agreement to Sell No. 165, MBSL filed an ejectment action in the District Court of Nugegoda by the case No. L/495/2013 against the customer for recovery of possession of the property situated at Madiwela which was already in the name of MBSL by virtue of the said Deed of transfer bearing No. 164. In the meantime, the customer, through his Attorney arrived at a settlement with MBSL for transferring back the said property for a payment of 6.5Mn, which was approved by the Board of Directors at the Board Meeting held on 26th November 2014 (Board Paper No. C&RC/2014/463/029) and entered as a court settlement in the aforesaid case.

- Finally the property situated at Madiwela aforesaid was transferred back by the Deed of Transfer bearing No. 3809 dated 21st July 2016 attested by I.K. Gunasiri NP upon receipt of said LKR 6.5 Mn.

Prepared by
Malithi Ambalangodage
Assistant Manager - Legal

<u>ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම</u>

(විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය)

(2019.12.10 දින සිට මෙම ආයතනය උසස් අධ්‍යාපන, තාක්ෂණ නවෝත්පාදන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 පෙබරවාරි මස 22 වන දින
2019 මැයි මස 08 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. <u>සංයුක්ත සැලැස්ම</u>

කොමිසම විසින් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, 2015න් පසුව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ බවත් 2019 සිට 2023 දක්වා සකස් කරමින් පවතින සංයුක්ත සැලැස්ම පිළිබඳවත් කරුණු විමසීම.

වර්ෂ 2015 - 2019 අතර කාලය සඳහා සංයුක්ත සැලැස්මක් පිලියෙල කර නොමැති බවත්, වර්ෂ 2019 – 2023 සඳහා සංයුක්ත සැලැස්මක් පිලියෙල කර ඇති නමුත් එය මෙතෙක් අනුමත වී නොමැති බවත්, නව කොමසාරිස්වරයා පත් වූ විට එය අනුමත කර ගැනීමට කටයුතු කරන බවත් වැඩ බලන කොමසාරිස් විසින් පවසන ලදී.

<u>නිර්දේශ</u>

i. මෙම සංයුක්ත සැලැස්ම පිලිගත නොහැකි බැවින් නියමිත නිර්නායක අනුගමනය කර සංයුක්ත සැලැස්මක් සකස් කිරීම.
ii. විගණකාධිපති සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරින්ගේ උපදෙස් ලබා ගනිමින් සංවිධිත සංයුක්ත සැලසුමක් සකස් කර මාස 2ක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

02. <u>වාර්ෂික වාර්තා</u>

ආයතනයේ වාර්ෂික වාර්තා සභාගත කිරීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය.

2017 වාර්ෂික වාර්තාව අමාත්‍යාංශයට යොමු කර ඇති බවත්, මාස 03ක් ඇතුළත 2017 – 2018 වාර්ෂික වාර්තා සභාගත කළ හැකි බවත් වැඩ බලන කොමසාරිස් විසින් පවසන ලදී.

<u>**නිර්දේශ**</u>

මාස 03 ක් ඇතුළත මෙම කාර්යය අවසන් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

වාර්තා කර නොමැත.

03. <u>2014.08.22 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම</u>

i. පාසල්වල සහ විශ්වවිද්‍යාල හා වෙනත් ආයතනවල නව නිපැයුම් සමාජ පිහිටුවීම සහ ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය විමසීම. (නියෝග අංක 06)

මීට ප්‍රථම සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම තුළින් නව නිපැයුම් සමාජ පිහිටුවීමේ පසුබිම පිළිබඳ සාකච්ඡා කළ බවත්, 2016 – 2017 සහ 2000 – 2006 ක්‍රියාකාරී සැලැස්ම තුළින් නව නිපැයුම් සමාජ පිහිටුවීමේ ක්‍රියාවලිය ඇතුළත් කර තිබූ නමුත් පසුව සකස් කළ වාර්තාවල මෙම කාරණා ඉවත් කර තිබුනද ආයතනවල ඉල්ලීම අනුව 2014 – 2018 කාලය තුළ නව නිපැයුම් සමාජ 03ක් පිහිටුවා ඇති බවත් 2019 දී එය නැවත ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බවත්, ඒ අනුව පාසල්, විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතනවල මෙම සමාජ පිහිටුවීමට යෝජිත බවත් වැඩ බලන කොමසාරිස් පැවසීය.

<u>**නිර්දේශ**</u>

කාරක සභාව දුන් නියෝගයක් ක්‍රියාකාරි සැලැස්මෙන් ඉවත් කිරීමට ගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ පිටපතක් කාරක සභාවට එවීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

වාර්තා කර නොමැත.

ii. ජාතික මට්ටමේ නව නිපැයුම් ලෙස හඳුනා ගත් නිර්මාණ 500ක් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විමසීම. (නියෝග අංක 09)

මෙහිදී අදහස් දැක්වූ වැඩ බලන කොමසාරිස් පවසන ලද්දේ,

- වාර්ෂිකව ‘‘සහසක් නිපැයුම්’’ නමින් ජාතික මට්ටමේ ප්‍රදර්ශනයක් පවත්වන බවත්,

- එහිදී එක් වර්ෂයකට නව නිපැයුම්කරුවන් 400ක් පමණ හඳුනා ගනු ලබන බවත්,
- මෙය මුලු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන බවත්,
- අවසානයේ මෙම සියලු නව නිපැයුම් කොළඹ දී පැවැත්වෙන ප්‍රදර්ශනයකට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්,
- පසුව ඔවුන්ගේ නව නිපැයුම්වලට පේටන්ට් බලපත්‍රය ලබා දීමට කටයුතු කරන බවත් ය.

<u>නිර්දේශ</u>

නව නිපැයුම්කරුවන් 08දෙනෙකු සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇති මුත් එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකි බව කාරක සභාවේ මතය වූ අතර පහත විස්තර ඇතුලත් සවිස්තර වාර්තාවක් මාසයක් තුල කාරක සභාවට ඉදිරිපත් කිරීම.

- 2016, 2017 හා 2018 වර්ෂවල ආයතනය විසින් හඳුනාගත් නව නිපැයුම්කරුවන්ගේ නම
- ලිපිනය
- නව නිපැයුම
- නිපැයුම් වලට අදාල විස්තර
- එම නව නිපැයුම්කරුවන්ට ආයතනය ලබා දුන් දායකත්වය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

iii. නව නිපැයුම්කරුවන් 11දෙනෙකුට ලබා දුන් රු.9,700,000/-ක් වූ ණය මුදලින් පියවීම් කර තිබුනේ රු.382,316/-ක් බව නිරීක්ෂණය වීම. (නියෝග අංක 13)

මෙය 2014 වර්ෂයේ සිදු වූ සිදුවීමක් වන අතර, එවකට සිටි නිලධාරීන් මේ සම්බන්ධව කටයුතු කර තිබුනද අය කර ගැනීම කළ නොහැකි බව වාර්තා කර ඇති බව වැඩ බලන කොමසාරිස් විසින් සඳහන් කරන ලදී.

<u>නිර්දේශ</u>

i. අය කර ගැනීමට නොහැකි ණය නියමිත ක්‍රමවේදයක් අනුගමනය කර කපා හැරීම.
ii. ඉදිරියේදී ණය ලබා දීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

04. <u>මාධ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාවය</u>

2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 සහ 3.4.4 ප්‍රකාරව වෙළෙඳපොල මිල සැසඳුම් ක්‍රමවේදය අනුව මිල ගණන් කැඳවීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හෝ ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටුවල සඳහන් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවිය හැකි වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද වටිනාකම රු.4,583,265/-ක් වූ ප්‍රසම්පාදනයන් 2කට අදාලව මිල ගණන් කැඳවීම සඳහා සැපයුම්කරුවන් තෝරාගත් ක්‍රමවේදය පැහැදිලි නොවීම.

මෙම කරුණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා නොගත් බවත්, පිටස්තර ආයතනයකට භාර දී මෙය සකස් කළ බවත්, සැපයුම්කරුවන් තිදෙනෙකු අතරින් එක් ආයතනයක් තෝරා ගත් බවත්, එම ආයතනය රේන්බෝ පේජස් වල තිබූ බවත්, ආයතනයේ සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සිදු වූ බවත් නිලධාරීන්ගේ අදහස විය.

<u>නිර්දේශ</u>

විගණකාධිපති සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමග සම්බන්ධ වී ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

05. <u>ප්‍රසම්පාදන කටයුතු</u>

2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1.(ඊ) ප්‍රකාරව ලංසු ඇගැයීමේ හා තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය හා නිත්‍යභාවය සහතික වීම සඳහා පිරිවිතර සකස් කිරීමේ දී අවශ්‍යතාවය පැහැදිලි ව දැක්විය යුතු වුවත්, වටිනාකම රු.5,305,000/-ක් වූ ප්‍රසම්පාදන 2කට අදාළව සකස් කර තිබූ පිරිවිතරවල කොමිසමෙහි අවශ්‍යතාවය පැහැදිලිව සඳහන් කර නොතිබීම.

<u>නිර්දේශ</u>

i. උක්ත කාල වකවානුවට අදාලව ආයතනයේ හිටපු කොමසාරිස්වරුන් තිදෙනා කාරක සභාව හමුවට කැඳවීම.
ii. අමාත්‍යංශ මට්ටමින් පූර්ණ පරීක්ෂණයක් පවත්වා මාසයක් තුළ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.
iii. ආයතන මට්ටමින් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

06. **<u>මූල්‍ය ආධාර ප්‍රදානය</u>**

2016 හා 2017වර්ෂවලදී නව නිපැයුම්කරුවන් 11දෙනෙකු සඳහා එකතුව රු.7,720,345/-ක මූල්‍යාධාර ප්‍රදානයන්ගෙන් අවස්ථා 3කදී ලබා දුන් රු.4,133,879/- අරමුදල්වලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබූ බවත් ණය හෝ ආධාර ලබා දුන් පසු ඔවුන්ගේ ප්‍රගතිය ඇගැයීමේ විධිමත් පසු විපරම් ක්‍රමවේදයක් සකස් කර නොමැති බවත් තවදුරටත් නිරීක්ෂණය වීම.

මෙහිදී ආයතනයේ අධ්‍යක්ෂ විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- යම් ප්‍රදානයක් කළ පසු මාස 3ක් ඇතුළත අදාල බිල්පත් ඉදිරිපත් කළ යුතු අතර සමහර නව නිපැයුම්කරුවන් එම කාර්යය නිසි කාලය තුළ නිම නොකරන බවත්,
- එවැනි අවස්ථාවල ඔවුනට අදාල මුදල ආයතනයට ආපසු ගෙවීමට සිදුවන බවත්,
- මූල්‍ය ආධාර ප්‍රදානය කිරීම විවිධ ආයතනවල නිලධාරින් නියෝජනය කරන ස්වාධීන මණ්ඩලයක් මගින් සිදුවන බවත්,
- පියසේන කොඩිකාර නම් නව නිපැයුම්කරුට ඒ ආකාරයට ආපසු මුදල් ගෙවන ලෙස දැනුම් දී ඇති බවත් ය.

<u>සටහන</u>

මේ අවස්ථාවේදී කාරක සභාවේ නියමය පරිදි කාරක සභාව හමුවේ කරුණු ඉදිරිපත් කිරීම සඳහා පැමිණි පියසේන කොඩිකාර නම් නව නිපැයුම්කරු ප්‍රකාශයක් කරමින් පහත කරුණු අනාවරණය කරන ලදී.

- තමා විසින් 2007 වර්ෂයේදී කෙසෙල් කොළ වලින් ගමන් මලු සෑදීමේ නව නිර්මාණය සිදු කළ බව,
- ඒ සඳහා 2008 දී කෙසෙල් කෙඳි වෙන් කිරීමේ යන්ත්‍රයක් තමා විසින් නිපදවූ බව,
- එම නිර්මාණයට තමාට පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට හැකි වූ බව,
- 2016 වර්ෂයේදී නව නිපැයුම් දිරිය වැඩසටහනක් ක්‍රියාත්මක වන බවට නව නිපැයුම්කරුවන්ගේ සංගමය මගින් පුවත්පත් දැන්වීමක් පළ කර තිබූ අතර තමාද ඒ සඳහා ඉදිරිපත් වූ බව,
- එහිදී තමාගේ නිෂ්පාදනය ප්‍රථම ස්ථානය දිනාගත් බව,
- පසුව මෙම නිෂ්පාදනය සාර්ථක කර ගැනීම සඳහා නූල් කැටීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.ලක්ෂ 7කට අධික මුදලක් කොමිසමෙන් ලැබුණු නමුත් මාස 3ක් තුළ එම යන්ත්‍රය ලබා ගැනීමට

නොහැකි වූ අතර අදාල මුදල කොමිසමට ආපසු ගෙවන ලෙස තමා වෙත දැනුම් දුන් බව,

- ඒ ආකාරයට එම මුදල ජූලි මාසයේ ආපසු භාර දුන් බව,
- නව නිපැයුම් වෙනුවෙන් නැවත වරක් තමා වෙත ලැබුනු රු. ලක්ෂ 20ක් මුදලක් යන්ත්‍ර 2ක් මිලදී ගැනීම වෙනුවෙන් නිමල් ජයවර්ධන නමැති පුද්ගලයාට ලබා දෙන මෙන් එවකට හිටපු කොමසාරිස් විසින් තමාගෙන් ඉල්ලා සිටි බව,
- පසුව තමා විසින් එම මුදල කඹුරුපිටිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නිමල් ජයවර්ධන මහතාගේ නමින් බොරැල්ලේ තිබූ ගිණුමක තැන්පත් කළ බව,
- ඉන් පසුව නිමල් ජයවර්ධන මහතා මුණ ගැසුණු අතර යන්ත්‍ර පරීක්ෂා කිරීමට ඉන්දියාවට යා යුතු බව පැවසූ බැවින් තමා සහ තම පුත්‍රයාත් නිමල් ජයවර්ධන මහතා සහ ඔහුගේ පුත්‍රයාත් පෙබරවාරි 7 වන දින ඉන්දියාවට ගිය බව,
- එහෙත් මෙම යන්ත්‍ර නිෂ්පාදනය කරන ආයතනයේදී නිමල් ජයවර්ධන මහතාව හඳුනා නොගත් බව,
- මෙම යන්ත්‍ර මිලදී ගැනීම ගැන ඔහු කිසිම සාකච්ඡාවක් නිෂ්පාදන සමාගම සමග කර නොමැති බව තමා හට පෙනී ගිය බව,
- එහිදී යන්ත්‍ර මිලදී ගැනීමක් සිදු නොවූ අතර පසුව හිස් අතින් ලංකාවට පැමිණි බව,
- ඉන් පසුව කොමසාරිස්වරයා මුණ ගැසීමට නොහැකි වූ අතර නිමල් ජයවර්ධන මහතා මෙම යන්ත්‍ර ලබා ගැනීමට සම්බන්ධ වූ දේශීය සමාගමේ හිමිකරු බව.

<u>නිර්දේශ</u>

i. මූල්‍යා ප්‍රදානය දුන් පසු ඒවා පසු විපරම් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.
ii. මෙම සිද්ධිය ඇතුලු සිදුවීම් 3 සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණයක් අමාත්‍යාංශ මට්ටමින් පැවැත්වීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

07. <u>විදේශීය ප්‍රදර්ශන සඳහා නව නිපැයුම් යොමු කිරීම</u>

විදේශීය ප්‍රදර්ශන සඳහා පිරිස් යැවීමේදී අනුගමනය කරන ක්‍රමවේදය පිළිබඳව විමසීම.

“සහසක් නිමැවුම්“ නම් වූ ප්‍රදර්ශනයක් පැවැත්වෙන බවත්, ඊට අමතරව පේටන්ට් බලපත්‍රලාභීන් අගය කිරීම සඳහා ජනාධිපති සම්මාන උළෙලක්

පැවැත්වෙන බවත්, ආයතනය මගින් පවත්වන තරඟවලින් ජයගන්නා නව නිපැයුම්කරුවන් විදේශයන්හි පැවැත්වෙන ප්‍රදර්ශනවලට සහභාගි කරවන බවත්, 2016 වර්ෂයේදී ජයග්‍රහණය කළ කණ්ඩායමට විදේශ සංචාර ලබා දුන් නමුත් එම කණ්ඩායම ඒ සඳහා සහභාගී වීමට අකමැති වූ අතර ඒ බව වාචිකව ඉදිරිපත් කර ඇති බවත්, එබැවින් දෙවන ස්ථානය ලබා ගත් කණ්ඩායමට එම අවස්ථාව ලබා දුන් බවත් ආයතනයේ නිලධාරීන් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.

<u>නිර්දේශ</u>

i. 2016, 2017 සහ 2018 වර්ෂවල පැවැත්වූ විදේශ ප්‍රදර්ශන සඳහා සහභාගි වූ අයගේ නාම ලේඛනය, ජයග්‍රහණය ලබා ගත් අයගේ නාම ලේඛනය, සහ තෝරා ගත් පසු සහභාගි වීම ප්‍රතික්ෂේප කළ අයගේ නාම ලේඛනයක් කාරක සභාවට ලබා දීම.

ii. ප්‍රථම ස්ථානය දිනා ගත් පුද්ගලයා වෙනුවට දෙවන ස්ථානය දිනා ගත් පුද්ගලයා විදේශ සංචාරයේ නිරත වූයේ සත්‍ය වශයෙන්ම ප්‍රථම ස්ථානය ලබා ගත් අය ඒ සඳහා අකමැති වූ නිසා ද යන්න කාරක සභාවට වාර්තා කිරීම.

iii. ජයග්‍රහණය නොලද යම් අයෙකු විදේශ සංචාරයකට යවා ඇත්නම් ඒ සඳහා යොදා ගත් පදනම කුමක්ද යන්න ගැනත් කාරක සභාවට වාර්තා කිරීම.

iv. ඉහත සියලුම වාර්තා විගණකාධිපතිට ද ලැබීමට සැලැස්වීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

08. <u>උපදේශකයන් පත්කිරීම</u>

උපදේශකයන් තෝරාගැනීම හා සේවයේ නියුක්ත කරවීම සඳහා වූ 2007 මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කර සංවිධායකයින් තෝරා ගත යුතු වැඩසටහන් 04ක් සඳහා, භාණ්ඩ හා වැඩ සඳහා වූ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ප්‍රකාරව වෙළඳපොල මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කර ගනිමින් වැඩසටහන් සංවිධායකයන් තෝරා ගෙන රු.10,734,765/-ක් ගෙවීමට එකඟ වී තිබුණු අතර එම සේවාවන් ඉටු කර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්ශ්වය අතර ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර වැඩසටහන් 2කට අදාලව පුවත්පත් 17ක දැන්වීම පලකිරීම සඳහා රු.2,490,000/-ක් අදාළ සේවා සපයන ආයතනයට ගෙවා තිබුනද, ඉන් පුවත්පත් 11ක තොරතුරු ද, එක් වැඩ සටහනකට අදාළව රූපවාහිනී වැඩ සටහනක් සඳහා රු.1,450,000/- වැය කර තිබුන ද එම වැඩ සටහන පිළිබඳ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොවුන බව නිරීක්ෂණය වීම.

නිර්දේශ

i. මෙම වැඩසටහන්වලට අදාල තොරතුරු සතියක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii. මෙම සේවාව සපයන ආයතනය දැන්වීම සඳහා ප්‍රමාණය ඉක්මවා මුදල් අය කර තිබේද යන්න පරීක්ෂා කිරීම.

iii. සති 2ක් තුළ මෙම සේවා සපයන ආයතන තෝරා ගත් ආකාරය පරීක්ෂා කර වාර්තා කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

09. "සහසක් නිමැවුම්" ප්‍රදර්ශනය

මෙම ප්‍රදර්ශනය සඳහා 2018 වර්ෂයේ ටී ෂර්ට් මුද්‍රණය කර ඇති අතර එම ක්‍රියාවලිය තුළ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය වීම.

i. කාර්ය සඳහාද මිල ගණන් කැඳවීම නියමිත ආකාරයෙන් සිදුවී නොමැත.

ii. සැපයුම්කරුවන් තෝරා ගත් ආකාරය අපැහැදිලි වීම.

iii. T-shirt 350 අවශ්‍යතාවයට T-shirt 1270 ක් මුද්‍රණය කිරිම.

නිර්දේශ

විගණකාධිපතිවරයා විසින් මේ සම්බන්ධව ඉදිරිපත් කර ඇති විගණන විමසුමට පිළිතුරු සති දෙකක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

ආයතනය 2019.02.22 දින කාරක සභාවට කැඳවීමෙන් අනතුරුව වර්තමාන ප්‍රගතිය පිළිබඳව විමසා බැලීම සඳහා 2019.05.08 දින නැවත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවීමට කාරක සභාව විසින් තීරණය කරන ලදී. එහිදී පහත කරුණු සාකච්ඡාවට බඳුන් විය.

01. පසුගිය කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ

පසුගිය කාරක සභාවේදී සාකච්ඡාවට භාජනය වූ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අමාත්‍යාංශ වාර්තා අධ්‍යයනය කිරීමේදී, විගණකාධිපති හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා අවශ්‍ය නම් භාණ්ඩාගාරයේද සහාය ලබා ගෙන ඒකාබද්ධ පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් යවන ලෙස කළ නිර්දේශ පරිදි කටයුතු කර නොමැති බව හා විගණකාධිපති වාර්තා පරිශීලනය කොට නොමැති බව නිරීක්ෂණය වීම.

<u>නිර්දේශ</u>

නිවැරදිව සකස් කරන ලද වාර්තාවක් සති 2 ක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ටී- ෂර්ට් මුද්‍රණය කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධ වාර්තාවක් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MSTR/IA/COPE/2019 හා 2019 දෙසැම්බර් මස දින රහිත ලිපිය මගින් ඉදිරිපත් කර ඇති අතර, අපේක්ෂිත තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කර නොමැත.

02. <u>විශ්‍රාමික නිලධාරීන්ගෙන් කරුණු විමසීම</u>

හිටපු කොමසාරිස් ආචාර්ය මහේෂ් එදිරිසිංහ මහතාගෙන් පහත සඳහන් කරුණු පිළිබඳව විමසීම.

i. මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම.
ii. ආයතනයට උපදේශකයින් බඳවා ගැනීම.
iii. සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා **T-shirt** මුද්‍රණය කිරීම.
iv. නව නිපැයුම්කරුවන්ට දීමනා ප්‍රදානය කිරීමේදී සිදු වී ඇති අක්‍රමිකතා සහ ඔවුන් විදේශ සංචාරවල නිරත කරවීමේදී වාර්තා වී ඇති විවිධ අසාධාරණ ක්‍රියා.
v. අමාත්‍යාංශ වාර්තාවේ සඳහන් වන මාධ්‍ය ප්‍රතිපත්තියක් සැකසීම සහ නව නිපැයුම්කරුවන්ට දිරි දීමනා ප්‍රදානය කිරීම.

පහත සඳහන් හේතු නිසා ආයතනයට මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුනු බව හිටපු කොමසාරිස්වරයා විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.

i. ප්‍රදර්ශන වලට සහභාගි කරවීම සහ මූල්‍ය ප්‍රදාන දීම යන ආකාර දෙකෙන් නව නිපැයුම්කරුවන්ට අනුග්‍රහය දැක්වීම.
ii. නව නිපැයුම්කරුවන්ට සමාජයේ නිසි තැන ලබා දීම.
iii. නව නිපැයුම් සොරකම් කිරීම වැලැක්වීම.

තවද, නව නිපැයුම් සොරකම් කිරිමේ අවදානම මග හරවා ගැනීමට මාධ්‍ය මගින් සුවිශාල මෙහෙයක් කළ හැකි බවත්, නව නිපැයුම් පිළිබඳව අසත්‍ය ප්‍රවෘත්ති පලවීම නිසා ඔවුන් අපහසුතාවයට පත් වන බවත් ඒ නිසා නව නිපැයුම්කරුවන් මේ තත්ත්වයෙන් මුදවා ගැනීම සඳහා මාධ්‍ය ප්‍රතිපත්තියක්

අවශ්‍ය වූ බවත්, 2016.10.26 වන දින ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස ප්‍රකාශයට පත් කළ බවත් ඔහු විසින් පැවසීය.

මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ආයතනයක් තෝරා ගැනීමට අනුගමනය කළ යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගැන කාරක සභාව විසින් කළ විමසීමේදී,

- මෙම දිනවල පැවති ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුමනය කරමින් මිල ගණන් කැඳවා සුදුසු ආයතනයක් තෝරා ගත් බවත්,
- කාරක සභාවේ සභාපතිතුමා වෙත ඇති මාධ්‍ය ප්‍රතිපත්තිය සහ මාර්පෙදේශනය නම් ලේඛනය ආයතන විසින් සකස් කළ මාධ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනය බව තහවුරු කරන බවත්,
- මෙම මුල් ලේඛනය භාෂා 3කින් සකස් කළ බවත් ඒ සඳහා තෝරා ගත් ආයතනය **3 i creative solutions** නමැති ආයතනය බවත්,
- එම ආයතනයට ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කිරීමේ කාර්යය භාර දුන් බවත් හිටපු කොමසාරිස්වරයා විසින් තවදුරටක් පැවසීය.

අමාත්‍යාංශ වාර්තාව අනුව මෙම ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම දෝෂ සහිත බව කාරක සභාවේ අදහස වූ අතර ඒ සම්බන්ධයෙන් කාරක සභාවේ බලවත් අප්‍රසාදය පළ විය.

03. <u>මාධ්‍ය ප්‍රකාශක තනතුර</u>

"නව නිපැයුම්කරුවන්ගේ සංගමයේ මාධ්‍ය ප්‍රකාශක තනතුර කොමසාරිස්වරයා විසින් දැරිය යුතුය" යනුවෙන් ඇති වගන්තිය පිලිබඳව කරුණු විමසීම

මෙම වගන්තිය අනුව ආයතනයේ නිලධාරියෙක් මෙම කාර්යය සඳහා පත් කිරීමට කොමිසමට බලය ඇති බවත්, මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරිමේ මූලික අදියර වශයෙන් පැවති වැඩමුළුව 2007.08.31 දින ගලදාරි හෝටලයේ පැවැත්වූ බවත් හිටපු කොමසාරිස් විසින් පවසන ලදී.

<u>නිර්දේශ</u>

පහත සඳහන් තොරතුරු සතියක් තුළ කාරක සභාවට ලබා දෙන ලෙස හිටපු කොමසාරිස්වරයාට නියෝග කිරීම.

- මෙම වැඩමුළුවට පැමැණි විද්වත් මණ්ඩලයේ සාමාජිකයන් කවුද;
- ඔවුන් ලබා දුන් වාර්තාව කුමක්ද;
- ඔවුන්ට කළ ගෙවීම් මොනවාද;
- **3 i creative solutions** ආයතනයේ කාර්යභාරය කුමක්ද;

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

04. 3 i creative solutions ආයතනය තෝරා ගැනීම

උපදේශක ආයතනයක් ලෙස 3 **i - creative solutions** ආයතනය තෝරා ගන්නේ කුමන අවශ්‍යතාවයකටද යන්න විමසීම.

මෙම කරුණ සම්බන්ධව අදහස් පල කරමින් හිටපු කොමසාරිස් විසින් පවසන ලද්දේ,

- අවශ්‍ය කාර්යයන් සඳහා ආයතනයේ සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් සේවක සංඛ්‍යාව වැඩි කිරිම සඳහා අනුමැතිය ඉල්ලා ඇති බවත්,
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් නිසි ක්‍රමවේදය අනුගමනය කර යම් උපදේශන සේවා සපයන ආයතනයකට එම කටයුතු භාර දෙන ලෙස මුදල් අමාත්‍යාංශය දැනුම් දි තිබූ බවත්,
- **Expression of Interest** ක්‍රමවේදය අනුගමනය කරමින් මිල ගණන් කැඳවූ අතර පුවත්පත් දැන්වීම් 2017.09.08 දින **"Daily News"** පුවත්පතේ පමණක් පළ කළ බවත්,
- අවසාන දිනය 2017.09.11 වූ බව හා ආයතන 3ක් මිල ගණන් ඉදිරිපත් කළ බවත්,
- ඒ අතරින් ආයතනයේ අවශ්‍යතාවය අනුව ගැලපෙන සැපයුම්කරු **3 i creative solutions** නම් ආයතනයට මෙම කාර්යය පැවරීමට තීරණය කළ බවත් ය.

මෙම **3 i creative solutions** නැමැති ආයතනය, **3 i Training Solutions** නැමැති ආයතනය යටතේ ඇති අනු ආයතනයක් බවත්, එය කිසිසේත්ම මෙවැනි උපදේශන සේවා සපයන ආයතනයක් නොවන බවත්, මෙම ආයතනය ලියාපදිංචි වී ඇත්තේ පුවත්පත් දැන්වීම් පළ කළ දිනට පසුව බවත් නිරීක්ෂණය කළ කාරක සභාව, එවැනි ආයතනයකට මෙවැනි කාර්යයක් පැවරීම ගැන සිය බලවත් අප්‍රසාදය පළ කළාය.

05. නව නිපැයුම්කරුවෙකු වන පියසේන කොඩිකාර මහතා

මෙම පුද්ගලයාගේ නව නිපැයුමට අදාලව යන්ත්‍ර 03ක් මිලදී ගැනීම සඳහා ලබා දෙනු ලැබූ රු.ලක්ෂ 20ක මුදල හා ඒ සඳහා ඉලෙක්ට්‍රො ඉංජිනියර්ස් ආයතනය සම්බන්ධ කර ගැනීම.

අදාළ මුදල් ලබා ගැනීමෙන් පසු සාමාන්‍යයෙන් මාස 03 ඇතුළත එම භාණ්ඩ මිලදීගත යුතු බවත්, පසුව විමසීමේදී ඔහු එම උපකරණ එම සමාගමෙන් ලබා ගෙන නොමැති බව පැවසූ බවත්, ඒ අනුව කොමිසමේ දැන්වීම පරිදි එම මුදල ඔහු විසින් ආපසු දුන් බවත් වෙනත් ආයතනයක්

මෙම උපකරණ ගෙන්වීමට එකඟත්වය පළ කළ බැවින් ඉන් පසුව ඒ සඳහා ඉලෙක්ට්‍රෝ ඉංජිනියර්ස් ආයතනයේ නිමල් ජයවර්ධන මහතා සම්බන්ධ වූ බවත් හිටපු කොමසාරිස් පවසන ලදී.

නිර්දේශ

මෙසේ අතරමැදියෙකු සම්බන්ධ වී කරන මෙම මිලදී ගැනීමේ ක්‍රියාවලිය තුළ කිසිදු විශ්වසනීයත්වයක් නැති බව අවධාරණය කළ කාරක සභාව ආයතනය ඍජුව මැදිහත් වී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සිදු කිරීම වඩාත් යෝග්‍ය බව පැවසූ අතර, හිටපු කොමසාරිස්වරයා සෑම කටයුත්තකටම එකම ආයතනය තෝරා ගැනීම නිසා ලබැඳියාවන්ගේ ගැටුමක් (**Conflict of Interest**) නිර්මාණය විය හැකි බැවින් ඉදිරියේදී රටේ පවතින නීතිරීති හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට පියවර ගැනීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

06. ජාත්‍යන්තර ප්‍රදර්ශනවලට සහභාගී වූ නව නිපැයුම්කරුවන්

ලෝකයේ විවිධ ස්ථානවල පැවැත්වෙන ප්‍රදර්ශනවලට සහභාගී වීම සඳහා නව නිපැයුම්කරුවන් පිටත්ව යන අතර, ඒ සඳහා එකම කණ්ඩායමක් සහභාගී වී ඇති බව නිරීක්ෂණය වීම.

නිර්දේශ

වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකිරීම් ක්‍රමවේදය ඇතුළත් නිර්දේශ ද සහිත වාර්තාවක් මාස 03ක් තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම සහ එම වාර්තාව විගණන පනතට අනුව ජාතික විගණන කාර්යාලයට ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

(මුදල් අමාත්‍යාංශය)

(2019.12.10 දින සිට මෙම ආයතනය මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 මාර්තු මස 07 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. සම්පූර්ණයෙන් ස්වයංක්‍රීය මධ්‍ය බැංකු පද්ධතියක් පිහිටුවීම (Fully Automated Core Banking System)

ගිණුම් හා අනෙකුත් අන්තර් කටයුතු පවත්වාගෙන යාම සඳහා, වෙනත් බැංකුවල ක්‍රියාත්මක කරනු ලබන ආකාරයේ මධ්‍යම බැංකු පද්ධතියක් මෙම බැංකුවෙහි නොමැති බවත්, මේ පිළිබඳව 2013 දෙසැම්බර් මස 13 වන දින පැවති කාරක සභා රැස්වීමේදී ද පෙන්වා දෙන ලද බවත් අවධාරණය කිරීම සහ ඒ සම්බන්ධව ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව විමසීම.

මේ සම්බන්ධව සාමාන්‍යාධිකාරී විසින් පවසන ලද්දේ,

- මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයුම් කමිටුවක් පත් කර අවශ්‍ය කටයුතු සිදු කළද එවකට සිටි සභාපතිගේ මැදිහත්වීම මත සිදුවීමට ගිය ටෙන්ඩර් පටිපාටිය උල්ලංඝනය කිරීමක් හේතුවෙන් එය නතර වූ බවත්,
- නැවත එම වකවානුවේදී එය ක්‍රියාත්මක නොවුන බව හා ඉන් පසුව 2016/06/01 දින පත් කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව විසින් වාර්තාවක් ඉදිරිපත් නොකරන ලද බවත්,
- 2018/10/10 දින පත් කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව රේඛීය අමාත්‍යාංශය වෙනස්වීම හේතුවෙන් අවලංගු වූ බවත්,
- නව තාක්ෂණික ඇගයුම් කමිටුවක් පත් කරන ලෙස අමාත්‍යාංශයෙන් 2019/02/13 දින ඉල්ලීමක් කර තිබෙන බවත් ඒ අනුව 2019 වසරේ නොවැම්බර් මස අග වන විට මධ්‍යම බැංකු පද්ධතිය ආරම්භ කිරීම සඳහා වැඩපිළිවෙල සකස් කර තිබෙන බවත් ය.

නිර්දේශ

මෙම කටයුත්ත මෙතරම් කාලයක් පමාවීම පිළිබඳව සොයා බැලිය යුතු බව පෙන්වා දුන් කාරක සභාව, පහත තොරතුරු ඇතුලත් වාර්තාවක් අමාත්‍යාංශ ලේකම්ගේ ද සහයෝගය ඇතිව විගණකාධිපති විසින් මාසයක් ඇතුළත ලබා දීම.

- 2016 ජූනි 01 දී පත් කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව රැස්වූ වාර සංඛ්‍යාව
- එම රැස්වීම්වල කාර්ය සටහන්
- අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුලු තාක්ෂණික ඇගයුම් කමිටුවෙහි වෙනස්කම් සිදු වූ ආකාරය
- 2018 වසරේ පත් කරන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව කුමක් ද යන්න
- එය රැස්වූ වාර සංඛ්‍යාව

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු සභාපතිගේ 2019.03.18 දිනැති ලිපියෙන් සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

02. උපයන විට ගෙවීම් බද්ද (PAYEE Tax)

මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සේවා නියුක්තිකයන්ගේ උපයන විට ගෙවීම් බද්ද (PAYEE Tax) බැංකුව විසින් ගෙවා තිබෙන බවත්, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබෙන චක්‍රලේඛ අංක 03/2016ට පටහැනිව 2018 මූල්‍ය වර්ෂය තුලදී බැංකුව විසින් උක්ත බදු රු.මිලියන 20ක් ගෙවා තිබෙන බවත් නිරීක්ෂණය වීම.

මෙම ක්‍රමවේදය දීර්ඝ කාලයක සිට සියලුම බැංකු විසින් වෘත්තීය සමිති හා සාමූහික එකඟතාවයක් අනුව ක්‍රියාත්මක කරන ලද බවත්, වෘත්තීය සමිති සමග සාකච්ඡා කර දෙපාර්ශවයටම අවාසි සහගත නොවන ආකාරයේ පිළියමක් සාකච්ඡා කරන බවත්, මීලඟ ගිවිසුම අත්සන් කරන විට දැනට අනුගමනය කරන ක්‍රමවේදය වෙනස් කිරීමට ක්‍රියා කරන බවත් මෙහිදී අදහස් දක්වමින් සභාපති විසින් පවසන ලදී.

නිර්දේශ

මේ සම්බන්ධයෙන් අදාල වෘත්තීය සමිති සමග සාකච්ඡා කරන ලෙසත්, උපයන විට ගෙවීම් බදු මුදල සේවකයන්ගෙන් අය කර මුදල් අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

03. ඇපයට තබා ගත් දේපල වෙන්දේසි කර ගත නොහැකිවීම

2008 වසරේදී රු.මිලියන 9ක ණය මුදලක් ලබා දී ඇපයට තබා ගත් දේපොල විකුණා හිඟ මුදල ආපසු අය කර ගත නොහැකි වී ඇති බව පෙන්වා දුන් කාරක සභාව මේ පිළිබඳ කරුණු විමසීම.
මෙහිදී සාමාන්‍යාධිකාරී විසින් අදහස් දක්වන ලදී. එනම්,

- මෙය බැංකුවට අත්පත් වූ දේපලක් බව,
- මේ සඳහා ගැණුම්කරුවන් දෙදෙනෙකු ඉදිරිපත්ව තිබෙන බව,
- එක් ගැණුම්කරුවෙකු ඇපකරයක් ලෙස ඔහුගේ ඉතිරි කිරීම් ගිණුමෙහි රු.මිලියන 7.5ක මුදලක් තැන්පත් කර තිබෙන බව,
- මෙම ගැණුම්කරුවන් දෙදෙනාගෙන් වඩාත් වාසිදායක ගැණුම්කරුට මෙම දේපල විකිණීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබෙන බව,

04. ආයතනයේ පවතින පුරප්පාඩු

ආයතනයේ පවතින විධායක ශ්‍රේණියේ පුරප්පාඩු 31ක් නොපිරවීමට හේතු විමසීම.

මේ වන විට ආයතනයේ ශාඛා 25ක් පවතින බවත් සංයුක්ත සැලැස්මට අනුව 2023 වන විට ශාඛා ජාලය 40 දක්වා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන බවත් එය සලකා බලමින් සේවක සංඛ්‍යාව තීරණය කර තිබෙන බවත් අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලබන බවත් සාමාන්‍යාධිකාරි විසින් අදහස් දක්වන ලදී.

තවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය සහ සැලසුම්) තනතුර 2013 වසර පමණ සිට පුරප්පාඩුව පවතින බවත් එම තනතුර තාවකාලිකව නොපිරවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබෙන බවත් සාමාන්‍යාධිකාරි විසින් තවදුරටත් පැවසීය

නිර්දේශ

i. මේ සම්බන්ධයෙන් වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මුදල් අමාත්‍යාංශයට, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාලයට සහ විගණකාධිපතිවරයාට සතියක් ඇතුළත ලබා දීමට කටයුතු කිරීම.

ii. පහත සඳහන් කරුණු පිළිබඳ වාර්තාවක් සතියක් ඇතුළත ලබා දීම.

- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය සහ සැලසුම්) තනතුරෙහි පුරප්පාඩුව පිරවීම අනවශ්‍ය බව තීරණය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය කුමක්ද?
- මෙම තීරණය පිළිබඳව මුදල් අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබේද?

- මුදල් අමාත්‍යාංශයෙන් සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා අනුමැතිය ලබා ගෙන තිබේද?

iii. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා තොරතුරු තාක්ෂණ සුදුසුකම් සහිත පුද්ගලයකු බඳවා ගන්නා ලෙස දන්වන ලද වාර්තාව සතියක් තුල දී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාලයට සහ විගණකාධිපති වෙත ලබා දීම.

iv. මෙම තනතුරු පුරප්පාඩු වූයේ කෙදිනක සිටද යන්නත් එම තනතුරු අවශ්‍ය බව හෝ අනවශ්‍ය බව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත්තේ කුමන ඇගැයීමක් සිදු කිරීමෙන්ද කුමන තත්ත්වයන් යටතේද යන්න පිළිබඳව වාර්තාවක් බැංකුවේ ද සහාය ලබා ගනිමින් ජාතික විගණන කාර්යාලය විසින් සකස් කර මාසයක් ඇතුළත කාරක සභාව වෙත ලබා දීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

නිර්දේශිත වාර්තා කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

05. <u>අක්‍රිය ණය</u>

1) ගණුදෙනුකරුවන්ගේ ආදායම් තක්සේරුව නිසි පරිදි සිදු නොකරමින් රු.මිලියන 14ක ණය 6ක් ලබා දී තිබෙන බවත් 2015 වසරේදී අයවීමට තිබූ හිඟ මුදල රු.මිලියන 11ක් බවත් මේ වන විට හිඟ මුදල රු.7,638,000/-ක් බවත් මෙයින් ණය 4ක් අක්‍රිය ණය ලෙස සලකා තිබෙන බවත් පෙන්වා දුන් කාරක සභාව මෙසේ සැලකීම පිළිබඳ කරුණු විමසීම.

2) 2016/12/31 දිනට විශාලතම අක්‍රිය ණය අටෙහි වටිනාකම රු.මිලියන 48ක් වූ බවත් 2019/02/27 දිනට ඉතිරි ණය හතෙහි හිඟ වාරික මුදල රු.මිලියන 37ක් බවත් මෙයින් ගණුදෙනුකරුවන් පස් දෙනෙකුට අදාලව නෛතික ක්‍රියා මාර්ග ගෙන තිබෙන බවත් දෙදෙනෙකුට අදාලව ණය මුදල් ගෙවන ලෙස සිහි කැඳවීම් ලිපි යවා තිබෙන බවත් මොවුන්ගෙන් එස්.ඒ.පී. සේනානායක නැමැති පුද්ගලයා වෙත රු.මිලියන 23.4ක මුදලක් ලබා දී තිබෙන බවත් 2019/02/27 දිනට එහි හිඟ මුදල රු.මිලියන 26ක් වන බවත් නිරීක්ෂණය කිරීම.

<u>නිර්දේශ</u>

මෙම කරුණු පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ද පිටපත් සහිතව විගණකාධිපති වෙත ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව

(ජනමාධ්‍ය අමාත්‍යාංශය)

(2019.12.10 දින සිට මෙම ආයතනය තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 මාර්තු මස 08 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. <u>භාණ්ඩාගාර නියෝජිත</u>

භාණ්ඩාගාර නියෝජිතවරයා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයෙකු ලෙස නොසිට නිරීක්ෂකයෙකු ලෙස පමණක් කටයුතු කිරීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු වූ අතර, ජාතික වැදගත්කමකින් යුතු මෙවන් ආයතනයක භාණ්ඩාගාර නියෝජිතවරයා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වාදීම.

<u>නිර්දේශ</u>

පනත සංශෝධනය කිරීම මඟින් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ අංක PS/NC-6/CP/131/2019 හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධූරය නීත්‍යානුකූලව පිහිටුවීම හා 1982 අංක 06 දරණ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත කාලීනව සංශෝධනය කිරීම යන මැයෙන් ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව සඳහා 2019.06.25 කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක එම්එම්අයි/7/7/3/2-3 හා 2019.07.12 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත දන්වා ඇත. **(ඇමුණුම 02)**

02. <u>සංයුක්ත සැලැස්ම</u>

සංස්ථාව විසින් තමන්ට ලඟා කර ගත නොහැකි අරමුණු සහිතව සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබීම සහ එම සැලැස්ම යාවත්කාලීන නොකිරීම නිසා ක්‍රියාකාරී සැලැස්මේ සහ ප්‍රසම්පාදන සැලැස්මේ කාර්යයන් ද ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

<u>නිර්දේශ</u>

- **i.** සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම.
- **ii.** සංයුක්ත සැලැස්ම; ආයතනයේ සේවකයන්ගේ දක්ෂතා/හැකියා වලින් උපරිම ප්‍රයෝජනයක් ගත හැකි ලෙස සැකසීම.

iii. සංස්ථාව විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද 2018 වර්ෂයේ රාජ්‍ය ආයතනවලට කරන ලද සේවා සැපයීම්වල මූල්‍යමය අගය පිළිබඳ වාර්තාවේ විස්තරාත්මක විගණනයක් මාසයක් ඇතුළත (Detailed Audit) සිදු කිරීමට කටයුතු කරන ලෙස විගණකාධිපතිට දැනුම්දීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

i. 2017 – 2019 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඇති සංයුක්ත සැලැස්ම කාරක සභාවට ඉදිරිපත් කර ඇති අතර, 2020 - 2022 සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව කාරක සභාවට දැනුම් දී ඇත.

ii. ඉහත නිර්දේශ (ii)ට අදාළ වාර්තාව ඉදිරිපත් කර නොමැත.

03. <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

ආයතනයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ විමසීම.

<u>**නිර්දේශ**</u>

2019 ප්‍රසම්පාදන සැලැස්මේ පිටපත් ජාතික විගණන කාර්යාලයට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ලබා දීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

2019 වර්ෂයට අදාළ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

04. <u>විගණන විමසුම්</u>

ජාතික විගණන පනතේ ඇති ප්‍රතිපාදන අනුව ආයතනයකට ඉදිරිපත් කරන විගණන විමසුම් සඳහා දින 21ක් ඇතුළත පිළිතුරු නොසැපයීම දඬුවම් ලැබිය යුතු වරදක්ව තිබියදීත් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම ප්‍රමාද වීම පිළිබඳ කාරක සභාව විමසා සිටියාය.

<u>**නිර්දේශ**</u>

මාසයක් ඇතුළත අදාල විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

වාර්තා කර නොමැත.

05. අලෙවි අධ්‍යක්ෂ තනතුර

අලෙවි අධ්‍යක්ෂක තනතුර අනුමත කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක් ලෙස ඇතත් එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමක් සිදු වී තිබීම පිළිබඳ විමසීම.

නිර්දේශ

i. අලෙවි අධ්‍යක්ෂ තනතුර ස්ථිර වශයෙන් පිරවීමට ඉක්මනින් කටයුතු කිරීම.
ii. තාවකාලිකව කර ඇති පත්වීමට අදාල නිසි අනුමැතිය ලබා ගැනීම.
iii. මෙම තනතුරට අදාල පහත තොරතුරු ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී උක්ත සේවා දිගුව ගැන අනුමැතිය ලබා දීමට පෙර කාරක සභාවට සහ විගණකාධිපතිට ලබා දීම.
    - පත්කිරීම
    - සේවා දිගුවක් ලබාදීම
    - තනතුරට අදාළ සුදුසුකම්
    - කාර්යසාධනය

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම තනතුරට තාවකාලිකව කර ඇති පත්වීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇතත් ස්ථිර වශයෙන් පිරවීමට අදාළව ප්‍රගතිය වාර්තා කර නොමැත.

06. කාර්ය මණ්ඩලය

2018.12.31 වන විට කොන්ත්‍රාත් පදනම මත සහ සේවා පැවරුම් මත රාජකාරී කරන 110ක පිරිසකගෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලය සමන්විත බව කාරක සභාවට අනාවරණය විය.

නිර්දේශ

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව පූර්ණ ලෙස සමාලෝචනයක් සිදු කර මාසයක් ඇතුළත කාරක සභාවට වාර්තාවක් ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

07. සංස්ථාව පිහිටි ඉඩම් අයිතිය සහ සම්ප්‍රේෂණාගාරය

2016.07.21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශ ලේකම් සමග සාකච්ඡා කර සති 02ක් තුළ

තීරණයක් ගන්නා ලෙස නිර්දේශ කර තිබුණත් මේ වන තුරු ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවීම පිළිබඳ කාරක සභාව විමසීම.

<u>නිර්දේශ</u>

2016.07.21 දින සිට මේ දක්වා මෙම කරුණ සම්බන්ධයෙන් අමාත්‍යවරුන් සමග පැවති සාකච්ඡාවල ප්‍රගතිය ගැන විස්තරාත්මක වාර්තාවක් සාකච්ඡා සටහන් සමග කාරක සභාව වෙත එවීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

08. <u>ජනාධිපතිවරණ මැතිවරණ ප්‍රචාරක කටයුතු</u>

මේ සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ පුද්ගලයන් දෙදෙනෙක් සේවයෙන් ඉවත් කර ඇති නමුත් එම මුදල් මේ වන තෙක් අය කර ගැනීමට කටයුතු කර නොතිබීම සහ සංස්ථාව මඟින් මේ පිළිබඳව කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු වීම.

<u>නිර්දේශ</u>
අදාල පාර්ශ්වයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මේ පිළිබඳව ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධව කාරක සභාව දැනුවත් කර ඇත.

09. <u>ගුවන් කාලය ණයට විකිණීම</u>

2018.12.31 වන විට වසර 05කට වැඩි කාලයක් පවතින ණය ගැති ශේෂය රු.72,377,998/-ක් හෙවත් 13%ක් ව පැවතීම පිළිබඳව සහ එම ණය අය කර ගැනීමට යොදා ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව විමසා සිටි අතර එහිදී පහත කරුණු අනාවරණය විය.

මෙම ගනුදෙනු නියෝජිත ආයතන හරහා සිදු කරන බව

- අදාල ණය සඳහා මාසයක ණය කාලයක් ලබා දෙන බව
- ඒ කාලය තුල අය කර ගැනීමට නොහැකි නම් මාසයේ සිට මාස 06 දක්වා කාලයක් ඉක්ම වූ පසු අදාල ආයතන වෙත සිහි කැඳවීම් ලිපි 03ක් යවන බව
- සිහි කැඳවීම් සඳහා ප්‍රතිචාර නොමැති නම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව

<u>නිර්දේශ</u>

මාස 06කට වඩා වැඩියෙන් ගෙවීම් සිදු කර නොමැති නියෝජිත ආයතන සහ වෙළඳ ආයතන පිළිබඳ සම්පූර්ණ විස්තරයක් කාරක සභාව වෙත ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

10. <u>ඉන්ධන දීමනා ගෙවීම</u>

භාණ්ඩාගාරයෙන් නිසි අනුමැතියකින් තොරව, චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව හිමි නොමැති MM, JM සහ MA ඛණ්ඩයේ නිලධාරීන් 151 දෙනෙකු සඳහා 2010 වර්ෂයේ සිට ප්‍රවාහන හා ඉන්ධන දීමනා ගෙවා ඇති බවත් මෙම ගෙවීම් අත්හිටුවීමට හා නැවත අය කර ගැනීමට ජනමාධ්‍ය ලේකම් විසින් 2010 අගෝස්තු 11 දින නියෝග කර තිබියදීත් එම නියෝගය නොසළකා අදාල ගෙවීම් අඛණ්ඩව කර ඇති බවත් කාරක සභාවට අනාවරණය වීම.

<u>නිර්දේශ</u>

ජනමාධ්‍ය ලේකම්ගේ අංක MMI / 8/1/3/26 හා 2010 අගෝස්තු 11 දිනැති රූපවාහිනී සංස්ථාවේ සභාපතිට යොමු කරන ලද ලිපිය උල්ලංඝණය කරමින් 2017, 2018 වර්ෂවල MM, JM සහ MA ඛණ්ඩයේ නිලධාරීන් සඳහා කර ඇති ඉන්ධන දීමනා පිළිබඳ විමර්ශනයක් සිදු කර එම වාර්තාව ජාතික විගණන කොමිෂන් සභාවට ද පිටපත් සහිතව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස විගණකාධිපතිට නිර්දේශ කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

11. <u>වැඩබැලීමේ දීමනා</u>

සංස්ථාව තුළ මාස 03 ඉක්මවා ක්‍රියාත්මක වන වැඩබැලීමේ තනතුරු 12ක් පැවතීම පිළිබඳව කාරක සභාව විමසන ලදී.

<u>නිර්දේශ</u>

i. අභ්‍යන්තර සේවක මණ්ඩලය අතුරින් මෙම තනතුරු සඳහා සිටින සුදුසු පුද්ගලයන් පත් කිරීම.

ii. අදාල තනතුරු සඳහා බඳවා ගැනීමට හැකිවන ලෙස සුදුසුකම් සහ වැටුප් පිළිබඳව සමාලෝචනය කර ස්ථිර තනතුරු සඳහා පත් කිරීමට අවශ්‍ය සුදුසුකම්, වැටුප් ආදිය පිළිබඳ වාර්තාවක් මාස 03ක් ඇතුළත අමාත්‍යාංශ මට්ටමෙන් සකස් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

12. <u>මතභේදාත්මක ගනුදෙනු</u>

2016 සහ 2017 වර්ෂ වලදී සංස්ථාව විසින් සංවිධානය කරනු ලැබූ විවිධ වැඩසටහන් වලට සහභාගී වූවන්ට සංග්‍රහ කිරීම සඳහා රු. 1,040,973/-ක් වැය කර තිබූ අතර විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය වී ඇත්තේ එම ගෙවීම් වලට අදාල බිල්පත් ව්‍යාජ ඒවා බැවින්, ඒ පිළිබඳව විමසීම.

<u>නිර්දේශ</u>

i. අමාත්‍යාංශ මට්ටමින් මේ පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් කර මාසයක් ඇතුළත වාර්තා කිරීම.
ii. ගෙවීම් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයක් ඇති බැවින් එය හඳුනාගෙන එයට පිළියම් යෙදීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මේ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් ස්වාධීන පරීක්ෂණයක් සිදු කරමින් පවතින බවට කාරක සභාවට වාර්තා කර ඇත.

13. <u>වාර්තා චිත්‍රපටිය - විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව</u>

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට වාර්තා චිත්‍රපටියක් නිෂ්පාදනය සඳහා ආයතනයේ නිලධාරීන් 03ක් මාස 03කට සංස්ථාවෙන් පූර්ණ කාලීනව නිදහස් කර ඇති බව සහ ඒ සඳහා අදාල නිලධාරීන් රුපියල් මිලියන 64ක් පෞද්ගලිකව අය කර ගැනීම පිළිබඳ කාරක සභාව විමසන ලදී.

<u>නිර්දේශ</u>

i. රූපවාහිනි සංස්ථාව මඟින් මෙම වාර්තා චිත්‍රපටිය නිෂ්පාදනය කිරීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ එකඟතාවයකට පැමිණ තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කර වාර්තා කරන ලෙස විගණකාධිපතිට නිර්දේශ කිරීම.
ii. සේවකයන් සේවයෙන් මුදා හැරීම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් අදාල ගනුදෙනුව පිළිබඳව ආයතන මට්ටමින් විනය පරීක්ෂණයක් සිදු කරන ලෙසත්,
iii. පහත කරුණු පිළිබඳ කාරක සභාවට වාර්තා කරන ලෙසත් අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශ කිරීම.

- මූල්‍ය අක්‍රමිකතාවයක් සිදුවී තිබේද?
- එසේ සිදු වී ඇත්නම් එයට වගකිව යුත්තේ කවුරුන්ද?
- ප්‍රශ්නගත නිලධාරීන් සඳහා වැටුප් රහිත නිවාඩු අනුමත කරන ලද්දේ කා විසින්ද?

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. ඉහත නිර්දේශ අංක (i)ට අදාළව වාර්තා ඉදිරිපත් කර නොමැත.

ii. මෙම කරුණ සම්බන්ධව ආයතන මට්ටමින් විනය පරීක්ෂණයක් සිදු කරන ලද අතර එම විනය පරීක්ෂණයේ නිර්දේශ අනුව සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි අදාල නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත.

14. <u>ලොතරැයි දිනුම් ඇදීම විකාශය</u>

ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීමේ ඒකාධිකාරී අයිතිය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හිමිව ඇති නමුත් ලොතරැයි විකාශය කිරීමේ ගුවන් කාලය පෞද්ගලික නියෝජිත ආයතන මඟින් සිදු කරමින් පැවතීම නිසා 2018 ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා කාලය තුළ රු. 79,342,110/- ක් නියෝජිත කොමිස් ලෙස සහ රු. 838,930/- ක් අලෙවි විධායක කොමිස් ලෙස සංස්ථාවට ගෙවීමට සිදුව තිබීම පිළිබඳ කාරක සභාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර මෙම තත්ත්වය වහාම නිවැරදි විය යුතු බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී.

<u>නිර්දේශ</u>

මෙම නියෝජිත ආයතන සමඟ ඇති ගිවිසුම් පිළිබඳ විශේෂ විගණනයක් සිදු කරන ලෙස විගණකාධිපති දැනුවත් කරන ලදී.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

ඇමුණුම 02

රහසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION   අමාත්‍ය මණ්ඩල තීරණය   அமைச்சரவைத் தீர்மா

මගේ අංකය: අමප/19/1703/101/109   2019 ජූලි මස 03 දින.

පිටපත්:

නීතිපතිතුමා.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල් අමාත්‍යාංශයේ ලේකම්.
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්.
විගණකාධිපති.

ක්‍රියා කළ යුතු :

ජනාධිපති ලේකම්
අමාත්‍ය මණ්ඩලයේ නොවන ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.
නීති කෙටුම්පත් සම්පාදක.

අමාත්‍ය මණ්ඩලයේ නොවන ජනමාධ්‍ය අමාත්‍යාංශය - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධුරය නිත්‍යානුකූලව පිහිටුවීම හා 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත කාලීනව සංශෝධනය කිරීම

(අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2019-06-07 දිනැති සංදේශය)

2019 ජුනි මස 25 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්.

අ.කළේ/එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

→2

මෙම තීරණය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වේ නම් කරුණාකර 0112329621 දුරකථන අංකය මඟින් ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් විමසීම මැනවි.

(ආ) **න්‍යාය පත්‍රයේ විෂයයන්:**

(I) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා - සාමාන්‍ය:

13. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 19/1703/101/109 වූ, **"අමාත්‍ය මණ්ඩලයේ නොවන ජනමාධ්‍ය අමාත්‍යාංශය - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ධුරය නිත්‍යානුකූලව පිහිටුවීම හා 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත කාලීනව සංශෝධනය කිරීම"** යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2019-06-07 දිනැති සංදේශය - ඉහත සඳහන් සංදේශය මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

(i) මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණවල අවධාරණය කරනු ලැබ ඇති කරුණු සැලකිල්ලට ගනිමින් සංදේශයේ සඳහන් කාර්යය සඳහා සංශෝධන ව්‍යවස්ථා කෙටුම්පත් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම; සහ

(ii) ඉහත (i)හි පරිදි සකස් කරන ලද පනත් කෙටුම්පත ඒ සඳහා වන නීතිපතිතුමාගේ නිෂ්කාශනයද සමඟ සලකා බැලීම පිණිස අතිගරු ජනාධිපතිතුමා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මෙන් අමාත්‍ය මණ්ඩලයේ නොවන ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් දෙන මෙන් ජනාධිපති ලේකම්වරයාට දැනුම් දීම.

ක්‍රියා කළ යුතු: **ජනාධිපති ලේකම්** - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
අමාත්‍ය මණ්ඩලයේ නොවන ජනමාධ්‍ය අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.
නීති කෙටුම්පත් සම්පාදක - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

⟶ 3

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය

(විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය)

(2019.12.10 දින සිට මෙම ආයතනය නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 මාර්තු මස 15 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ විශේෂ විගණන විමර්ශනය

මේ පිළිබඳව සිදු කරන ලද පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කර තිබුණද 2017.06.06 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය පරිදි විශේෂ කමිටුවක් මගින් මූලික විමර්ශන කටයුතු සිදු කර නොතිබීම.

නිර්දේශ

විගණකාධිපති විසින් සිදු කරනු ලැබූ විශේෂ විගණන පරීක්ෂණයේ විගණන විමසුම් 2017 ජුනි මස 06 වැනි දින පොදු ව්‍යාපාර කාරක සභාවේ දී සාකච්ඡා කරන ලද අතර එහිදී ලබා දුන් නිර්දේශ වලට අදාල වාර්තාවක් විගණකාධිපති විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද අතර එහිදී ප්‍රධාන කරුණු 21 යටතේ විමසීම් සිදු කළද එහි ප්‍රගතියක් දක්නට නොලැබෙන බැවින් අද දින මේ සම්බන්ධයෙන් ලබා දෙන පිළිතුරුද සමග කාරක සභාවේ සභික මන්ත්‍රීන්ගේ එකඟතාවය සහිතව මෙම ගැටලු සියල්ල විශේෂ විගණන වාර්තාවක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කාරක සභාව තීරණය කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණ ද, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බාහිර ආයතන වලින් සම්බන්ධ වන අධ්‍යක්ෂවරුන්ගේ අදහස්, යෝජනා සහ පිළිගැනීම්, නොපිළිගැනීම් ද, ඔවුන්ගේ මතයද වෙන වෙනම ඉහත වාර්තාවට ඇමුණුමක් ඇතුළත් කරන ලෙස විගණකාධිපතිට නිර්දේශ කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

නිර්දේශිත සවිස්තර වාර්තාව විගණකාධිපතිගේ අංක VTY/ස.වි/වි.වා./2019 හා 2019.12.05 දිනැතිව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

02. විදේශගත වන ශ්‍රමිකයන්ගේ ගුණාත්මක අගය ඉහල නැංවීම

විදේශගත වන ශ්‍රමිකයන්ගේ ප්‍රමාණාත්මක අගයට සාපේක්ෂව ගුණාත්මක බව ඉහල නැංවීම තුළින් ආදායම් තත්ත්වය වර්ධනය කිරීමට කටයුතු කිරීම සම්බන්ධව අවධානය යොමු කිරීම.

<u>නිර්දේශ</u>

i. පුහුණු මධ්‍යස්ථාන 08 හිම අවුරුදු 5ක කාල සීමාවක් තුල ජාතික තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් (TVEC) ලබා ගන්නා ලද ජාතික වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය පිළිබඳ පහත විස්තර කාරක සභාවට සහ විගණකාධිපති වෙත සති 2ක කාලයක් තුළ ලබා දීම.

- ලබා ගැනීමට ඉල්ලුම් කළ දිනය
- සහතික ලැබුනු දිනය

ii. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධීකරණය කර ගනිමින් සහ තානාපති කාර්යාලවල සිටින සුභ සාධක නිලධාරී මාර්ගයෙන් පහත තොරතුරු ලබා ගැනීම.

- විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් අතරින් වෘත්තීය පුහුණු සහතික නොමැතිව උසස්වීම් ලබාගත නොහැකිව සිටින පිරිස් පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සේවය කර දැනට විශ්‍රාම ගොස් සිටින සහ විදේශයන්හි සේවය සඳහා කැමැත්තෙන් සිටින පුද්ගලයන් පිළිබඳ තොරතුරු ලබාගැනීම.
- එම තොරතුරු විදේශ සේවා නියුත්ති කාර්යාංශට ලබා දීම මගින් එසේ විදේශගත වීමට කැමැත්තෙන් සිටින පුද්ගලයන්ට ඒ සඳහා අවස්ථාවක් ලබා දීමට ක්‍රියා කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. ඉහත නිර්දේශ (i)ට අදාළ වාර්තාව විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ අංක IA/02/16/04 හා 2019.05.24 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ii. ඉහත නිර්දේශ අංක (ii)ට අදාළව පහත ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරක සභාව දැනුවත් කර ඇත.

- අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා විධිමත් සන්නිවේදන වැඩපිළිවෙලක් ආරම්භ නරන ලෙස සියලුම තානාපති කාර්යාලවල කම්කරු අංශ ප්‍රවර්ධන නිලධාරීන් වෙත දන්වා යවා ඇති බව.
- ආපසු පැමිණෙන ශ්‍රමික ප්‍රජාවට මෙම තොරතුරු කාර්යංශය වෙත ලබා දීම සඳහා දැන්වීමක්, ගොඩබසින අවස්ථාවේ ලබාදීමට කටයුතු කර ඇති බව.
- කුසලතා සහතික ලබාගැනීම සඳහා ඔවුන්ගේ නිපුණතාවය පරීක්ෂා කිරීමට දිවයිනේ ඇති ඇගැයීම් මධ්‍යස්ථාන සමඟ කාර්යංශය කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව.
- පුවත්පත් දැන්වීමක් පල කර, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ සේවය කර දැනට විශ්‍රාම ගොස් සිටින සහ විදේශයන්හි

සේවය සඳහා කැමැත්තෙන් සිටින පුද්ගලයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇති බව.

03. විදේශගත වූ ශ්‍රමිකයන්ගේ දරුවන් මෙරට පාසැල් හා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීම

රැකියා සඳහා විදේශගතව නැවත පැමිණෙන ශ්‍රමිකයන්ගේ දරුවන් පාසැල්වලට සහ විශ්වවිද්‍යාල වලට ඇතුළත් කිරීමේ දී පවතින ගැටලු සඳහා නිර්දේශ ඉදිරිපත් කළද ඒවා මෙතෙක් ක්‍රියාත්මක නොවීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය.

නිර්දේශ

i. සෑම දිස්ත්‍රික්කයකම ඇති ජාතික පාසලක එක් පන්ති කාමරයක් විදේශගත ශ්‍රමිකයන්ගේ දරුවන් වෙනුවෙන් වෙන් කිරීම සහ ඒ පිළිබඳ ප්‍රගතිය මාස 03ක් ඇතුළත කාරක සභාවට සහ විගණකාධිපති වෙත ලබා දීම.

ii. විශ්වවිද්‍යාලවලට මෙම ළමුන් ඇතුළත් කිරීමේදී ප්‍රමුඛත්වය ලබා දීම ගැන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මතය වාර්තාවක් මගින් ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

i. නිර්දේශ අංක (i) සඳහා වර්තමාන ප්‍රගතිය වාර්තා කර නොමැත.
ii. නිර්දේශ අංක (ii)ට අදාළව තොරතුරු ඉදිරිපත් කර ඇත.

04. මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රමිකයන් සඳහා වූ රක්ෂණ ක්‍රමය

මෙම කරුණ සම්බන්ධව කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

නිර්දේශ

i. උක්ත කරුණ පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ලබා දීම.
ii. පහත සඳහන් කරුණු ඇතුළත් වාර්තාවක් මසක කාලයක් ඇතුළත කාරක සභාවට සහ විගණකාධිපති වෙත ලබා දීම.

- මෙම රක්ෂණය ආරම්භ කරන ලද ක්‍රමවේදය;
- අනුගමනය කරන ලද ටෙන්ඩර් පටිපාටිය;
- මෙය ලබා දුන්නේ අඩුම ලන්සුවටද;
- මෙමගින් රටට සිදුවූ පාඩුව කොපමණද;

- මෙම රක්ෂණාවරණය යටතේ කොපමණ ශ්‍රමිකයන් පිරිසක් විදේශගත වී තිබේද;

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

නිර්දේශිත තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

05. විධිමත් අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩල දීමනා ගෙවීම

භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශය විසින් සකස් කර ගත් නිර්නායක මත ක්‍රම 09ක් යටතේ කාර්ය මණ්ඩල දීමනා ගෙවීමට කටයුතු කර තිබීම සහ 2017 හා 2018 වර්ෂවලදී ඒ සඳහා පිළිවෙලින් රු.83,174,556/-ක් හා රු.86,399,621/-ක් වැය කර තිබීම.

නිර්දේශ

මෙම ගෙවීම් විධිමත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම දීමනා ගෙවීමට අනුමැතිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බව දන්වා ඇතත් වර්තමාන ප්‍රගතිය වාර්තා කර නොමැත.

06. රටවිරු නිවාස ව්‍යාපෘතිය

2018 සැප්තැම්බර් 20 දින වන විට විගමණිකයින් 12,078දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මගින් රු. මිලියන 3,557/-ක ණය මුදලක් ලබා දී තිබුණු අතර විගමණිකයින් 2157දෙනෙකුට අයත් රු. 214,679,115/-ක ණය මුදල් ගෙවීම පැහැර හැර තිබීම සහ ඉන් 1,573දෙනෙකුට ණය ලබා දීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් රහිතව ණය ලබාදීම.

නිර්දේශ

නොගෙවූ ණය අය කර ගැනීම සඳහා ඉතා ඉක්මනින් සුදුසු ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම ණය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත්තේ සමෘද්ධි බැංකුව මගින් වන බැවින් ගෙවීම් පැහැර ඇති අයට විරුද්ධව විදේශ සේවා නියුක්ති කාර්යංශයට නීතිය ක්‍රියාත්මක කළ නොහැකි බැවින් ඔවුන්ට විරුද්ධව නඩු පැවරීමට සමෘද්ධි දෙපාර්තමේන්තුව ක්‍රිය කරන බව කාර්යංශයට දන්වා ඇති බව කාරක සභාවට දැනුම් දී ඇත.

07. **<u>විධිමත් අනුමැතියකින් තොරව සේවක රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම</u>**

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමේ හා හදිසි අනතුරු වන්දි ලබා දීමේ රක්ෂණ ක්‍රමයක් 1995 වසරේ සිට ක්‍රියාත්මක කර තිබීම සහ වාර්ෂිකව කාර්යාංශයේ ආදායමෙන් වන්දි මුදල් ගෙවීම.

<u>නිර්දේශ</u>

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර නොපමාව අදාළ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

08. **<u>වාහන අපහරණ කටයුතු ප්‍රමාද වීම</u>**

2015 වර්ෂයේ දී අපහරණය කිරීමට නිර්දේශ කර තිබූ වාහන 27ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබීම.

<u>නිර්දේශ</u>

මෙම වාහන 19 මාස 2ක කාලයක් තුළ දී අපහරණය කිරීමට කටයුතු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

09. **<u>විදේශගත වූ ශ්‍රමිකයන් පිළිබඳ තොරතුරු</u>**

විදේශගත වන පුහුණු ශ්‍රමිකයන් ගැන තොරතුරු වර්ගීකරණය කිරීමේ වැදගත්කම ගැන කාරක සභාව සාකච්ඡා කරන ලදී.

<u>නිර්දේශ</u>

i. 2015 සිට 2018 වර්ෂය දක්වා විදේශගත වූ පුහුණු ශ්‍රමිකයන් පිළිබඳ වර්ගීකරණය කරන ලද සම්පූර්ණ වාර්තාවක් කාරක සභාව සහ විගණකාධිපති වෙත ලබාදීම.

ii. ආසියානු කලාපයේ පුහුණු ශ්‍රමිකයන් විදේශගත වීමේ තත්ත්වය සමඟ උක්ත විස්තර සංසන්දනය කිරීම සහ ඒ පිළිබඳ වාර්තාවක් ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

අදාළ වාර්තා කාරක සභාව වෙත ලබා දී ඇත.

10. <u>විදේශ රටවලින් ලැබී ඇති රැකියා අවස්ථා</u>

මොරිෂස් දූපත්වලින් ශ්‍රී ලංකාවට ලැබී ඇති රැකියා අවස්ථා 10,000 සහ මැලේසියාවෙන් ලැබී ඇති රැකියා අවස්ථාවන් 50,000 අවම වැටුප් නියම කර තිබීම නිසා ඇතිවී ඇති ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීම.

<u>නිර්දේශ</u>

විශේෂ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීම මඟින් අවම වැටුප තීරණය කිරීමට පියවර ගැනීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ප්‍රගතිය වාර්තා කර නොමැත.

ශ්‍රී ලංකා මහ බැංකුව

(මුදල් අමාත්‍යාංශය)

(2019.12.10 දින සිට මෙම ආයතනය මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 මාර්තු මස 22 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. ලංකාසෙට්ල් පද්ධති නීතිවල පවතින නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම

ලංකාසෙට්ල් පද්ධති නීතිවල පවතින නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරන අවස්ථාවකදී ප්‍රාථමික තැරැව්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කිරීමට තිබෙන දණ්ඩන පැනවීම සිදු කිරීම පිළිබඳවත් එවැනි දණ්ඩන පැනවීමට අදාල නීති රාමුවක් බලාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව දැනට ගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳවත් කරුණු විමසීම.

බේරුම්කරණ දෙපාර්තමේන්තුව යටතේ පද්ධති නීති පවතින බවත් උල්ලංඝනය කිරීමක් සිදුවුවහොත් ඒ සඳහා දඬුවම් හඳුන්වා දී තිබෙන බවත් දැනට තිබෙන රාමුව තුළ පළමුවරට අවවාද කරනු ලබන බවත් ඉන් පසු සිදුවීමක් වුවහොත් දඩ අය කර ගැනීමේ ක්‍රමවේදයක් පවතින බවත් මෙහිදී අදහස් දක්වමින් මහබැංකු නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී.

නිර්දේශ

මෙලෙස වැරදි සහගතව සිදු කරනු ලබන ගනුදෙනු සඳහා ඉඩ නොතැබීම පිණිස බැංකු පනත සංශෝධනය කරමින් අවශ්‍ය කටයුතු කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

වාර්තා කර නොමැත.

02. මුදල් පනතින් පැවරී ඇති බලතල

මුදල් පනතේ බලතල අනුව බලපත්‍ර නිකුත් කළ හැක්කේ තැන්පතු භාර ගන්නා ආයතන සඳහා වන නමුත් බහුතරය තැන්පතු භාර නොගන්නා ආයතන වන්නේ නම්, තැන්පතු භාර නොගත්තද ණය නිකුත් කරනු ලබන ආයතන ද ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලෙස ලියාපදිංචි විය යුතු බවට පනත සංශෝධනය කල හැකි බව කාරක සභාව විසින් පෙන්වා දීම.

මෙහිදී මහබැංකු අධිපති විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- ක්ෂුද්‍ර මූල්‍ය පනතේ පවතින අඩුපාඩු හඳුනා ගනිමින් ණය නියාමන අධිකාරියක් පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව
- **Resolution and Enforcement** දෙපාර්තමේන්තුව යනුවෙන් නව දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කර තිබෙන බව හා එහි පොලිස් ඒකකයක් ද පවතින බව
- මෙමගින් අනවසර ලෙස තැන්පතු ලබා ගන්නා ආයතන කිහිපයක් හෝ හසු කර ගනිමින් නීතිමය පියවර ගැනීමට හැකි වුවහොත් එමගින් මෙවැනි සිදුවීම් වැළැක්වීමට හැකි වනු ඇති බව

දිවයින පුරා පවතින ආයතන අධීක්ෂණය කිරීමේ හැකියාවක් මහ බැංකුවට නොමැති බවත් අදාල පනත්වල දුර්වලකම් පවතින බැවින් දැඩි දඬුවම් සහිත නීති පද්ධතියක් අවශ්‍ය බවත් මුදල් පනත සහ බැංකු පනත සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බවත් මෙහිදී මහ බැංකු අධිපති විසින් වැඩිදුරටත් පවසන ලදී.

<u>නිර්දේශ</u>

මෙම කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

03. <u>වෝහාරික විගණනය (Forensic Audit)</u>

ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර වංචාවෙන් මහා භාණ්ඩාගාරයට සිදුවූ පාඩුව සොයා බැලීම පිණිස වෝහාරික විගණනයක් (Forensic Audit) සිදු කරන ලෙස මේ පිළිබඳව පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉල්ලා තිබෙන බවත් මේ සඳහා සිදු කරන ලද ඇස්තමේන්තු අගයට වඩා වැඩි මුදලක් වැය වන බවට තොරතුරු ලැබී තිබෙන බැවින් ඒ පිළිබඳව කාරක සභාව විසින් අවධානය යොමු කරන ලදී.

මෙහිදී මහබැංකු අධිපති විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

- මෙම වෝහාරික විගණනය සිදු කළ යුතු ක්ෂේත්‍ර 4ක් මුදල් මණ්ඩලය මඟින් හඳුනාගෙන තිබෙන බවත්,
- මහ බැංකුව විසින් නිර්ණේය කරුණු **(terms of reference)** සකස් කර තිබෙන බවත්,

- විගණන 6ක් සිදු කළ යුතු අතර ඒ සඳහා ලංසු 17 ක් ලැබුණු බවත්,
- විගණන 4ක් මෙම වසරේ අප්‍රේල් 1 වැනි දින ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්,
- 6 වැනි විගණනයේදී තොරතුරු ලබා ගැනීමේ කටයුතු වෙනුවෙන් බලාපොරොත්තු වූ මුදලට අධික මුදලක් වැය වන බැවින් ඇස්තමේන්තු මුදල වැඩි වී තිබෙන බවත්,
- පළමු විගණන 4 හි කටයුතු සැප්තැම්බර් මස වන විටද මේ වසර අවසාන වන විට සියලුම විගණනයන්හි කටයුතු ද අවසන් කිරීමට හැකි වනු ඇති බවත් ය.

<u>නිර්දේශ</u>

මහ බැංකුව විසින් ලබා දී තිබෙන නිර්ණේය කරුණු **(terms of reference)** සකස් කරන ලද්දේ කවුරුන් විසින්ද යන්නත්, මෙම විගණනය සිදු කිරීම සඳහා ලැබී තිබෙන ලංසු මොනවාද යන්නත්, ඒවා තෝරා ගත් ක්‍රමවේදය කුමක්ද යන්නත් ඇතුළත්ව ඉහතින් සඳහන් කරන ලද සියලුම කරුණු ඇතුළත් කොට වාර්තාවක් සති 2ක් තුළ කාරක සභාවට ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

04. <u>ව්‍යවහාර මුදල් කළමනාකරණය</u>

රුපියල් 5 කාසි අච්චු ගැසීමට යන වියදම වැඩි බවත් දැනට සිටින සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම සිදු කිරීම හෝ ජාත්‍යන්තර ටෙන්ඩර කැඳවීමෙන් මිලදී ගැනීම සිදු කිරීම තීරණය කරනු ලබන්නේ කුමන අවස්ථාවේදීද යන්නත් ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද යන්නත්, දැනට සිටින සැපයුම්කරුවන්ගෙන් කාසි මිලදී ගැනීමට පෙර පන්සල්, කෝවිල්, පල්ලි යනාදී ස්ථාන වලින් කාසි එකතු කර ගැනීමේ ක්‍රමවේදයක් පවතින්නේද යන්න පිළිබඳවත් විමසීම.

මෙහිදී පහත කරුණු අනාවරණය විය.

- ජාත්‍යන්තර මිල ගණන් කැඳවා සැපයුම ලබා ගැනීමට වසරක පමණ කාලයක් ගත වන බැවින් අවශ්‍යතාවය මත පවත්නා සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් මුදල් මණ්ඩලය වෙත බලය ලබා දී තිබෙන බව,

- කතරගම, බෙල්ලන්විල යනාදි ස්ථානයන්ගෙන් කාසි එකතු කර ගැනීමේ ක්‍රමවේදයක් ඒ ආසන්නයේ පිහිටි බැංකු විසින් ක්‍රියාත්මක කරන ලද බව,
- රට තුළ කොපමණ කාසි තොගයක් පවතින්නේද, කොපමණ ප්‍රමාණයක් සංසරණයේ පවතින්නේද, කොපමණ ප්‍රමාණයක් ඉදිරි මාස 12 සඳහා අලුතෙන් අවශ්‍ය වන්නේද යන්න සෑම වසරකදීම තක්සේරු කරන බව

<u>නිර්දේශ</u>

මෙසේ එකතු කරගන්නා ලද කාසි කොපමණ ප්‍රමාණයක් නැවත භාවිතය සඳහා යොදා ගෙන තිබෙන්නේද යන්න පිළිබඳ වාර්තාවක් ඉහත සඳහන් කරන ලද තොරතුරු ද ඇතුළත්ව මාසයක් තුළ කාරක සභාව වෙත ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

05. <u>භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු ක්‍රමවේදය</u>

මෙහිදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැඳුම්කර නිකුතු ක්‍රමවේදය පිළිබඳව කරනු ලැබූ ඉදිරිපත් කිරීම සංක්ෂිප්තව පහත පරිදි අදහස් දක්වන ලදී. එනම්,

- නව නිකුතු ක්‍රමයට පෙර වෙන්දේසි ක්‍රමය මත භාණ්ඩාගාර නිකුතු ක්‍රමයක් පැවති බව හා 2017 ජූලි මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු ක්‍රමවේදය හඳුන්වා දෙන ලද බව,
- මෙයට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සහ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශ හේතු පාදක වූ බව,
- මෙම ක්‍රම හඳුන්වා දීම මගින් රජයට වඩාත් යහපත් මිල මට්ටමක් යටතේ කාර්යක්ෂමතාවය වර්ධනය කර ගනිමින් විනිවිද භාවය උපරිම වශයෙන් ආරක්ෂා කර ගනිමින් කටයුතු කිරීමට හැකිවූ බව,
- පියවර 3ක් යටතේ මෙම නිකුතුව සිදුවන බව.

ප්‍රථමයෙන්ම, මහා භාණ්ඩාගාරයේ අවශ්‍යතාවය අනුව වෙන්දේසිය පිළිබඳ දැනුම් දෙන බවත් කල් පිරීම් වලට අදාල නිකුතු ප්‍රමාණ හඳුනා ගැනීම, නැවතුම් මිල **(cut off price)** සහ බර තැබීම මත එළදා අනුපාතය **(weighted average yield rate)** හඳුනා ගැනීම ටෙන්ඩර මණ්ඩලයේ කාර්ය වන බවත් ප්‍රථම අදියරේදී වෙන්දේසිය හරහාම නිකුතුව සිදු කරන බවත් සම්පූර්ණ අවශ්‍යතාවය ඉහත අයුරින් සපුරා ගැනීමට නොහැකි වුවහොත් ඉතිරිය සඳහා දෙවන අදියරේදී, පළමු අදියරේ කාර්ය සාධනය මත ඉල්ලුම් කළ හැකි බවත් සම්පූර්ණ ප්‍රමාණය දෙවන අදියරේදී සපුරා ගැනීමට නොහැකි වුවහොත් පළමු පියවරේදී

60%කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා ගත් ප්‍රාථමික වෙළඳුන්ට අනිවාර්ය පදනම යටතේ තෙවන අදියරේදී වෙන් කිරීම් සිදු කරනු ලබන බවත් මෙම ක්‍රියාවලිය පද්ධතිය හරහා පමණක්ම ක්‍රියාත්මක වන බවත් අවධාරණය කරන ලදී.

මෙයට සමගාමීව විනිවිද භාවය හා උපරිම කාර්යක්ෂමතාවය ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය වෙන්දේසි දින දර්ශනයක් ප්‍රකාශයට පත් කිරීම මගින් ඉදිරියේදී සිදු කරනු ලබන නිකුතුවට අදාල තොරතුරු පිළිබඳව ප්‍රසිද්ධියක් ලබා දෙන බවත්, මසකට එක් වෙන්දේසියක් පවත්වන බවත්, මෙම ක්‍රමවේදය හරහා **Bench Mark Yeild Curve** සකස් කර තිබෙන බවත්, ඒ අනුව වසර 3, 5, 8 සහ 10 වසර වලදී කල් පිරෙන ස්ථිර **(regular)** නිකුතු වලට සීමා කර තිබෙන බවත්, මේවා ඉතා ප්‍රචලිත බවත්, එමගින් රජයට යන පිරිවැය අඩු වී තිබෙන බවත් පෙන්වා දෙන ලදී.

එසේම කූපන් අගයන් සහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ක්‍රමානුකූලව සිදු නොවූ බවට චෝදනා තිබූ බවත්, ඒ අනුව මේ වන විට මෙම බැඳුම්කර නිකුත් කිරීමේදී වෙළඳපලෙහි දැනට පවතින ඵලදාවට **(Yeild)** ආසන්න අගයකට නිකුත් කරනු ලබන බවත්, අලුත් බැඳුම්කරයක් නිකුත් කිරීමේදී මුහුණත අගයට ආසන්න අගයකට ලංසු තැබීම අපේක්ෂා කරනු ලබන බවත්, නැවත විවෘත කරනු ලබන කූපන් සඳහා කූපන් අගය දැනට පවත්නා ඵලදා අනුපාතයට බොහෝ ආසන්න වන නිකුතු සිදු කරනු ලබන බවටත් අදහස් පල කරන ලදී.

මෙම නව ක්‍රමවේදය පිළිබඳව පහත සඳහන් කරුණු ද අවධාරණය කරන ලදී.

- මෙහෙයුම් අත් පොතට ඇතුළත් කර තිබීම.
- වෙන්දේසිය සඳහා නිකුත් කරන ලද ප්‍රමාණය පමණක් ලබා ගැනීම.
- ලංසුකරුවන්ගේ අනන්‍යතාවය හෙළිදරව් නොවීම.
- ටෙන්ඩර මණ්ඩල තීරණ වඩා ක්‍රමවත් වීමට සහ තොරතුරු මත දැනුවත් තීරණ ගැනීම සඳහා තාක්ෂණික ඇගයුම් කමිටු මූලික නිර්දේශයන් සිදු කිරීම.
- රටේ සාර්ව ආර්ථික තත්ත්වය, මූල්‍ය වෙළඳපල තත්ත්වය පිළිබඳව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කිරීම් මගින් ටෙන්ඩර මණ්ඩලය දැනුවත් කිරීම.
- ටෙන්ඩර මණ්ඩලයේ සාමාජිකත්වය පුළුල් කර තිබීම.
- රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ආවරණය වන ලෙස **CCTV** පද්ධතිය ස්ථාපිත කර තිබීම.
- රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ **Front, Middle, Back** කාර්යාල සහ **Lanka Secure** අංශය එකිනෙකින් වෙන් කර පවතින අතර ඒවා සඳහා පිවිසුම් පාලක පද්ධති සවි කර තිබීම.
- **Front Office** හි රාජකාරි දුරකථන ශබ්ද පටිගත කිරීම සිදු කර තිබීම.
- වෙන්දේසි දිනවලදී **Front Office** හි කාර්ය මණ්ඩලය සඳහා ජංගම දුරකථන භාවිතය සීමා කිරීම.

මෙම තත්ත්වය සලකා බැලීමේ දී කාරක සභාවේ අදහස වූයේ, භාණ්ඩාගාර බැඳුම්කර වංචාව සිදුවීමෙන් පසු භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා හඳුන්වා දුන් අලුත් ක්‍රමවේදය පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතු බවත්, මේ සම්බන්ධයෙන් මහජනතාවට ලැබී ඇති වාසි පිළිබඳව භාෂා තුනෙන්ම පුවත්පත් දැන්වීම් පල කිරීම අවශ්‍ය බවත්, එසේම විශ්වවිද්‍යාල, පාසැල්, කොටස් වෙළඳපල, ජනමාධ්‍ය සහ මේ සම්බන්ධයෙන් උනන්දුව දක්වන පාර්ශ්ව දැනුවත් කිරීම අවශ්‍ය බැවින් ඒ සඳහා ජනමාධ්‍ය භාවිතා කරමින් මේ පිළිබඳව දැනුවත් කිරීම කාලෝචිත අවශ්‍යතාවයක් බවත් ය.

<u>ලංකා විදුලිබල මණ්ඩලය</u>

<u>(විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය)</u>

(2019.12.10 දින සිට මෙම ආයතනය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 අගෝස්තු මස 23 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. <u>**අමාත්‍යාංශ ලේකම් පූර්ව දැනුම් දීමකින් තොරව විදේශගත වීම**</u>

අමාත්‍යාංශයේ ලේකම් විසින් පූර්ව දැනුම් දීමකින් තොරව විදේශගත වී ඇති අතර වැඩ බලන ලේකම් ලෙස අද දින සිට පත්වීම් ලබා ඇති කේ. වී. අයි. මල්ලිකා මහත්මිය කාරක සභා රැස්වීමට සහභාගි වූවාය

2016/01/28 දින ලංකා විදුලි බල මණ්ඩලය සම්බන්ධයෙන් පැවැත්වූ කාරක සභා රැස්වීමේ සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන් වන බොහෝ ගැටලු, විගණකාධිපතිගේ නිරීක්ෂණ මගින් මතු කර තිබෙන බවත් මෙයින් බොහෝ කරුණුවලට අමාත්‍යාංශයේ ලේකම් විසින් සෘජුව මැදිහත්ව තිබෙන බැවින් ඒ සම්බන්ධයෙන් ඔහු විසින්ම පිළිතුරු ලබා දිය යුතු බැවින් අද දින කාරක සභා රැස්වීම සඳහා සහභාගි වන වැඩ බලන ලේකම් විසින් ලබා දෙන පිළිතුරු පිළිබඳ පරස්පරතාවයක් මතු වුවහොත් එය සුදුසු නොවනු ඇති බවත් පෙන්වා දුන් කාරක සභාව මෙම ගැටලු සඳහා පිළිතුරු ලබා දීමේ හැකියාව පිළිබඳව අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්ගෙන් විමසීම.

එම කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් විසින්ම පිළිතුරු ලබා දීම වඩාත් යෝග්‍ය බව වැඩ බලන ලේකම් විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.

<u>නිර්දේශ</u>

ලංකා විදුලිබල මණ්ඩලය 2019/10/08 වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට නැවත කැඳවීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාවේ නිර්දේශ පරිදි 2019/10/08 වන දින ලංකා විදුලිබල මණ්ඩලය කාරක සභාව ඉදිරියට කැඳවන ලදී.

ආයතනය 2019.08.23 වැනි දින කැඳවීමෙන් අනතුරුව 2019.10.08 වන දින ප.ව.2.30ට නැවත වරක් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවන ලදී. එහිදී පහත කරුණු සාකච්ඡාවට බඳුන් විය.

01. ලංකා විදුලිබල මණ්ඩලයට LTL සමාගම සම්බන්ධයෙන් ඇති අයිතිය

LTL සමාගමෙහි අයිතිය, ආයතන ව්‍යුහය සහ විගණකාධිපතිවරයාට එය විගණනය සඳහා ඇති බලය පිළිබඳව 2016/01/28 දින පැවති කාරක සභා රැස්වීමේ දී කරන ලද විමසුමට පිළිතුරු ලෙස, 2016/09/21 දින පැවති ආර්ථික කළමනාකරණ කැබිනට් කමිටුව විසින් **LTL** සමාගම ප්‍රති සංවිධානය කර එහි ලංකා විදුලිබල මණ්ඩලය සතු කොටස් භාරය අඩු කර **LTL** සමාගමට මෙහෙයුම් නම්‍යශීලී බව ලබා දීමට සහ එමගින් ලාභය වැඩි කර ගැනීමට අවකාශ ලබා දිය යුතු බවට තීරණය කර තිබීම අනුව **LTL** සමාගම විසින් 2019/09/13 දිනැති ලිපිය මගින් ලංකා විදුලි බල මණ්ඩලය සතු කොටස් 25% දක්වා අඩු කළ යුතු බවට කර තිබෙන ඉල්ලීම පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය විසින් සඳහන් කර ඇත.

බහුතර අයිතිය 63%ක්ව තිබිය දී ලංකා විදුලිබල මණ්ඩලයට මෙම ආයතනයේ කටයුතු සඳහා මැදිහත් වීමට ඇති නීතිමය බාධා නිරවුල් කර ගැනීම සඳහා මේ පිළිබඳව නීතිපතිවරයා වෙත යොමු කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට නිර්දේශ කර තිබෙන බව කාරක සභාව පෙන්වා දුන් අතර **LTL** සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් 8දෙනාගෙන් 5දෙනෙකු ලංකා විදුලි බල මණ්ඩලය නියෝජනය කිරීම සඳහා පත් කළ යුතු වුවද එයින් සාමාජිකයන් 4දෙනෙකු පමණක් පත් කිරීම පිළිබඳවත් මෙම සමාගමෙහි ලංකා විදුලිබල මණ්ඩලය සතු 63%ක් වන කොටස් අයිතිය 25%ක් දක්වා අඩු කිරීමට තීරණය කිරීම පිළිබඳවත් කරුණු විමසීම.

<u>නිර්දේශ</u>

i. දැනට පවතින නීතිමය රාමුව යටතේ කටයුතු කිරීම.
ii. පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ මණ්ඩල ධූරය මසක් ඇතුලත පිරවීමට කටයුතු කිරීම.
iii. නීතිපතිවරයාගේ නිර්දේශය අනුව විගණන කටයුතු සඳහා විගණකාධිපතිවරයාට සහයෝගය ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

02. විදුලිය හදිසි මිලදී ගැනීම්

පහත කරුණු සඳහා හේතු විමසීම.

i. වසර 2016 සිට 2019 දක්වා කාලය නිරීක්ෂණය කිරීමේදී විදුලිය හදිසි මිල දී ගැනීම් පිරිවැය අධික වී තිබීම.
ii. ලංකා විදුලිබල මණ්ඩලයේ ජනන සැලැස්මක් තිබුණ ද ඊට පරිබාහිරව විදුලිය මිල දී ගැනීම් විශාල ප්‍රමාණයක් පැවතීම.
iii. මෙම කාලය තුල මෙසේ මිල දී ගත් ප්‍රමාණය රු. මිලියන 52,230ක් පමණ වීම.

iv. 2016 දී මෙ.වො. 155ක් වූ අවශ්‍යතාවය 2019 වන විට මෙ.වො. 720ක් වී ඇති තිබීම හා 2020 දී එය මෙ.වො. 920ක් පමණ වීම.

v. ජනන සැලැස්මට අනුව ලබා ගන්නා ප්‍රමාණය අඩු බැවින් හදිසි මිල දී ගැනීම් වැඩි වී තිබීම.

vi. සාම්පූර්හි අවලංගු කරන ලද විදුලි බලාගාරය වෙනුවට මෙ.වො. 100ක විකල්ප බල ශක්ති උත්පාදනය සහ කෙරවලපිටිය **LNG** බලාගාරය පිළිබඳ වර්තමාන තත්ත්වය.

vii. මෙරටට හිරු එළිය හොඳින් ලැබෙන බැවින් දහවල් කාලයේ දී සූර්ය බලය මගින් ජනනය කරනු ලබන විදුලිබලය ගබඩා කිරීමේ ක්‍රමයක් සකස් කිරීමට ඇති හැකියාව.

මෙහිදී කාරක සභාව විසින් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ, 2023 අවශ්‍යතාවයට අවම වශයෙන් 2019 වසරේ දී ටෙන්ඩර කිරීම කළ යුතු බවත්, සකස් කර තිබෙන වගුව (**chart**) අනුව 2016 සිට 2020 දක්වා මිල දී ගැනීම් වලින් වැඩි ප්‍රමාණයක් හදිසි මිල දී ගැනීම් බවත්, ඒ අනුව ස්ථාවර මිල දී ගැනීම් ක්‍රියාවලිය නතර වී හදිසි මිල දී ගැනීම් ක්‍රියාවලිය දිගටම සිදු වන බවත් ය.

මෙහිදී ආයතනයේ සාමාන්‍යාධිකාරී විසින් පහත අදහස් දක්වන ලදී.

i. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සහ කැබිනට් මණ්ඩල අනුමැතියට යටත්ව ජනන සැලසුම් සෑම වසර 2 කට වරක්ම සකස් කරන බව.

ii. ජනන සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ නම් හදිසි මිල දී ගැනීම් අවශ්‍ය නොවන බව.

iii. 2015 වසරේ දී සාම්පූර් බලාගාරයෙන් ද 2017 වන විට **Broadlands** සහ උමා ඔය බලාගාරවලින් ද විදුලිය ජනනය වීමට තිබුණු නමුදු මේ වන තෙක් ඒවා ක්‍රියාත්මක නොවන බව.

iv. මෙසේ වූ දිගු කාලීන සැලසුම් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් හදිසි විදුලිය මිල දී ගැනීම් කිරීමට සිදු වන බව.

අමාත්‍යාංශ ලේකම් විසින් තවදුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ,

2016 වසරේ සිට මෙ.වො. 35 බලාගාර 3ක්, මෙ.වො. 100 බලාගාරයක් සහ මෙ.වො. 24 බලාගාර 4ක් සඳහා විදුලිබල මණ්ඩලයේ ඉල්ලීම මත තාක්ෂණික කමිටු සහ ටෙන්ඩර මණ්ඩල, අමාත්‍යාංශය විසින් පත් කර තිබෙන නමුදු විවිධ හේතු මත විදුලිබල මණ්ඩලයෙන් ඒ පිළිබඳ නියාමනය කිරීමක් සිදු නොවන බවත් අභ්‍යන්තරයේ පවතින අර්බුද හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක වීම දුර්වල බවත් ය.

ඉහත විමසුම් අංක vi. සඳහා පිළිතුරු දෙමින් අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන) විසින් ප්‍රකාශ කරන ලද්දේ,

- මෙය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පදනම් ව සිදු කරන ව්‍යාපෘතියක් බවත්,
- විදුලි රැහැන් ඇදීමට සිදුවීම හේතුවෙන් එය ආර්ථික වශයෙන් වාසිදායක නොවන බවත්,
- එම ප්‍රදේශයේ වෙනත් විදුලි බලාගාර සෑදීමට තිබෙන හැකියාව අනුව මෙය ක්‍රියාත්මක කිරීමට හැකි බවත්,
- කෙරවලපිටිය **LNG** බලගාරය සඳහා වූ ඉඩම් මේ වන තෙක් නිත්‍යානුකූලව බාර දී නොමැති බව හා එම සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය ලැබුණහොත් පමණක් ඉදිරි කටයුතු සිදු කළ හැකි වන බවත් ය.

ඉහත විමසුම් අංක vii. සඳහා පිළිතුරු දෙමින් ප්‍රධාන ඉංජිනේරු (ජනන සැලසුම්) විසින් අනාවරණය කරන ලද්දේ,

- ඉදිරි වසර 10 සඳහා මෙ.වො. 1000ක සූර්ය බල ව්‍යාපෘති සඳහා සැලසුම් කර තිබෙන බවත්,
- දැනට **sustainable energy authority** සමග සාකච්ඡා කර පුනරින් සහ මොණරාගල මෙ.වො. 100 **solar parks** 2ක් ඉදි කිරීම සඳහා කටයුතු කරමින් සිටින බවත්,
- 2020 – 2039 සැලසුමෙහි **Battery storage system** සැකසීම සඳහා කටයුතු කර තිබෙන බවත් ය.

03. <u>විදුලි ජෙනරේටර් 50ක් මිල දී ගැනීම</u>

මෙ.වො. 1 ප්‍රවාහනය කරනු ලබන විදුලි ජෙනරේටර් 50ක් ලබා ගන්නා ලද්දේ හදිසි මිලදී ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ද යන්න පිළිබඳවත්, මෙම අවශ්‍යතාවය හඳුනා ගත් ආකාරය පිළිබඳවත්, මේ සඳහා සකස් කරන ලද පිරිවැය ඇස්තමේන්තුව සහ මෙම ජනන යන්ත්‍ර සවි කරන ලද ස්ථාන පිළිබඳව විමසීම.

මෙහිදී අදහස් දක්වමින් සාමාන්‍යාධිකාරීවරයා විසින් ප්‍රකාශ කරන ලද්දේ,

2016 වසරේ දී අමාත්‍යාංශයේ දී පවත්වන ලද රැස්වීමක දී, දුර බැහැර පළාත්වල තිබෙන **grid substation single line** එකක අඩපන වීමක් සිදු වුවහොත් විදුලි බලය ලබා දීම පිණිස එහි ගෙන ගොස් සම්බන්ධ කළ හැකි, වාහනයකින් ප්‍රවාහනය කළ හැකි ඩීසල් ජෙනරේටර් ලබා ගත යුතුය යන තීරණයට අනුව එම ප්‍රසම්පාදනය සිදු කර තිබෙන බවත් මේවා කන්ටේනර්ගත ලෙසට හඳුන්වා තිබෙන බවත් මේවා ඉක්මනින්ම ප්‍රවාහනය කළ නොහැකි බවත්, ඇස්තමේන්තුවක් සකස් කර තිබෙන අතර මෙය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබෙන බවත් මෙය රු. බිලියන 3ක් වන බවත් ය.
මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලද්දේ,

- මෙය තීරණය කරන ලද්දේ අමාත්‍යාංශයෙන් නොවන බවත්,

- 2016 වසරේ විදුලිබල හිඟය හේතුවෙන් **emergency** විදුලි බලය මෙ.වො. 50ක් මිලදී ගැනීමට සිදු වූ බවත්,
- ඒ අනුව සෑම අවස්ථාවක දීම මෙවැනි මිල දී ගැනීම් කිරීම වෙනුවට ලංකා විදුලිබල මණ්ඩලයට මෙවැනි ජනන යන්ත්‍ර 50ක් ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය සහිතව සිදු කරන ලද බවත්,
- මෙහි අදහස වූයේ ස්ථාපිත කිරීම නොව හිඟයක් හෝ හදිසි අවස්ථාවක් පැන නැගීම අනුව සවි කිරීමට හැකි වීම බවත් ය.

04. <u>ඌන උපයෝජිත ජනන යන්ත්‍ර</u>

i. 2019 සැප්තැම්බර් 28 දින වන විට මතුගම ප්‍රදේශයේ තිබෙන ජනන යන්ත්‍ර 12ක මෙහෙයුම් කටයුතු නතරවී ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය වීම.

ii. මෙම ආනයනය කරන ලද විදුලි ජනන යන්ත්‍රවල භාවිතා කරනු ලබන **Auto** ඩීසල් වල පැවතිය හැකි උපරිම සල්ෆර් මට්ටම 0.2% ක් වුව ද මෙරට භාවිතා කරනු ලබන ඩීසල් වල පවතින සල්ෆර් මට්ටම 0.3% ක් බැවින් මෙම ජනන යන්ත්‍ර ආපදාවට (**break down**) ලක් විය හැකි වීම පිළිබඳව විමසීම.

ඉහත **i.** සඳහා අදහස් දක්වන ලද අතිරේක සාමාන්‍යාධිකාරි (වත්කම් කළමනාකරණ) විසින් සඳහන් කරන ලද්දේ, මෙම යන්ත්‍ර අවශ්‍යතාවය පරිදි වෙනත් ස්ථාන කරා යැවිය හැකි ලෙස සකස් කර තිබෙන අතර මැයි මස 25 වැනි දින රාත්‍රියේ අකුණක් වැදීම හේතුවෙන් ජෙනරේටර් 8 ක **control system** දැවී ගිය බවත් ඊට පෙර 33 **KV** කේබලයට හානි වූ බවත් ය.

ඉහත **ii.** සඳහා අදහස් දක්වන ලද අමාත්‍යාංශ ලේකම් විසින් සඳහන් කරන ලද්දේ,

- ටෙන්ඩර් ලේඛනයන්හි කොන්දේසි වල සල්ෆර් මට්ටම 0.3% ට වඩා අඩු විය යුතු ලෙස සඳහන් වූ අතර ලංසුකරු ඉදිරිපත් කර තිබූයේ 0.2% ක මට්ටමක් බවත්,
- ඒ අනුව මෙහි සල්ෆර් මට්ටම ඉල්ලා සිටින ලද මට්ටමේ පැවති බවත්,
- ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරින් 10දෙනෙකුගේ කණ්ඩායමක් මෙම කර්මාන්තශාලාව වෙත ගොස් අනුමත කිරීමෙන් පසු මිල දී ගත් බවත්,
- යන්ත්‍ර නුසුදුසු නම් ගිවිසුම අනුව ආපසු යැවිය හැකි බවත්,
- ගැටලුව වී ඇත්තේ ඩීසල් සපයා ගැනීමේ ප්‍රශ්නය බවත් ය.

<u>නිර්දේශ</u>

පහත සඳහන් කරන ලද කරුණු අඩංගු වාර්තාවක් මසක කාලයක් ඇතුළත කාරක සභාව වෙත ලබා දීම.

- මෙහි දී සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය
- **TEC** වාර්තාව
- මෙම අදහස උත්පාදනය වූ ආකාරය
- මෙහි දැන් පවතින තත්ත්වය

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

05. <u>**ඇඹිලිපිටිය** ACE Power Plant **වෙතින් විදුලිය මිල දී ගැනීම.**</u>

2015 වසරේ දී ගිවිසුමේ කාලය ඉකුත් වීමෙන් **(expire)** පසු එය අලුත් කරන ලද බවත් එහිදී රජයේ තක්සේරුකරු විසින් ඇඹිලිපිටිය **ACE Power Plant** හි වටිනාකම රු.මිලියන 2370 ක් ලෙස තක්සේරුවක් ලබා දී තිබෙන බවත් එහි වටිනාකම රු.මිලියන 2450 ක් බව සමාගම විසින් පවසන ලද බවත් සමාගම සමග සාකච්ඡා කර මෙම බලාගාරය මිල දී ගැනීම වෙනුවට විදුලි බලය මිල දී ගෙන තිබෙන බවත් එහි දී ඔවුන්ගේ වසර 2 ක ලාභය රු.මිලියන 2551 ක් වූ බවත් එයින් මෙම **Power Plant** එක මිල දී ගත හැකිව තිබූ බවත් පෙන්වා දීම සහ ඒ පිළිබඳ කරුණු විමසීම.

මෙහිදී අමාත්‍යාංශ ලේකම් විසින් සඳහන් කරන ලද්දේ,

- 2016 වසරේ විදුලි හිඟයක් ඇතිවීම හේතුවෙන් මෙම **Power Plant** එක මිල දී ගැනීම සඳහා සාකච්ඡා කරන ලද බවත්,
- එම කටයුත්ත සඳහා දීර්ඝ කාලයක් ගත වන බැවින් වර්ෂයක කාලයකට විදුලිය මිල දී ගැනීමටත්,
- **Power Plant** එක මිල දී ගැනීමේ සාකච්ඡා සාර්ථක වුවහොත්, සාකච්ඡා කරන ලද දිනයේ සිට එය මිල දී ගන්නා දිනය දක්වා, මිල දී ගැනීමේ ගිවිසුම අත්සන් කරන පදනම මත විදුලිය මිල දී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු බවත්,
- මේ සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ මිල රු.මිලියන 2300ක් වූ අතර රු.මිලියන 300ක වැඩි මුදලක් තිබීම අනුව ටෙන්ඩර මණ්ඩලය මිල දී ගැනීම නිර්දේශ නොකරන ලද බවත් ය.

ඔහු විසින් තවදුරටත් කරුණු දක්වමින් පහත අදහස් දක්වන ලදී.

- මේ සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව වසර 10ක් පමණ මෙසේ මිලදී ගැනීමට සිදු වන්නේ නම් **Power Plant** එක මිල දී ගැනීම ගැටලුවක් නොවන බව,
- එහෙත් වසර 3ක් වැනි කාලයක් සඳහා දීර්ඝ කරනු ලබන්නේ නම් විදුලිය මිල දී ගැනීම වාසිදායක වන බව,
- ඒ අනුව, මෙම ආකාරයෙන් විදුලිය මිල දී ගෙන තිබෙන බව,

- දකුණු පළාතේ විදුලිය සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බැවින් ඇඹිලිපිටිය බලාගාරය අත්‍යාවශ්‍ය බවට විදුලිබල මණ්ඩලය යෝජනා කර තිබෙන බව,
- හම්බන්තොට - කොළඹ සම්ප්‍රේෂණ විදුලි රැහැනක් ඉදි කරමින් පවතින බව හා මෙහි වැඩ කටයුතු 2020 වර්ෂය වන විට අවසන් වීමෙන් පසු මෙම ගැටලුව විසඳෙන බව.

<u>නිර්දේශ</u>

i. විදුලිය මිලදී ගැනීම පිළිබඳව තීරණ ගැනීමේ ක්‍රියාවලිය, මිල දී ගන්නා ආකාරය, එම තීරණය හේතුවෙන් වූ ප්‍රතිඵලය යනාදිය පිළිබඳව අවම වශයෙන් වසර 2 ක කාල සීමාවක් සඳහා සවිස්තරාත්මක **dispatch audit** එකක් සිදු කරන ලෙස විගණකාධිපතිවරයාට නිර්දේශ කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

06. <u>**තුර්කි - බත්තල් (Barge) මත ඉදි කළ බලාගාර මගින් විදුලිය මිලදී ගැනීම**</u>

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබෙන වාර්තාවෙහි පහත කරුණු සඳහන්ව ඇති බව නිරීක්ෂණය කිරීම.

i. මෙම විදුලිය මිලදී ගැනීම් නිර්දේශ කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි සැලකීමක් හා පැකිලීමක් දැක්වීම සහ කෙටි කාලයක් තුල මේ පිළිබඳ නිර්දේශ කිරීමට තාක්ෂණික ඇගයුම් කමිටුව සූදානම් නොමැති වීම.
ii. 2019/05/18 දින ආරම්භ වන වෙසක් උත්සව සමයට පෙර මෙ.වො.200ක ධාරිතාවයකින් යුක්ත වන මෙම ජනන යන්ත්‍ර ලබා ගැනීම තහවුරු කිරීම.
iii. ලංකා විදුලිබල මණ්ඩලය මගින් 2019/03/22 වන දින දැන්වීම් මගින් කැඳවන ලද යෝජනාව සඳහා ප්‍රතිචාර ලෙස තුර්කියේ කරිඩීන්ස් හෝල්ඩින්ස් සමාගම ඉදිරිපත් කර ඇති කෙරවලපිටිය ප්‍රදේශයේ බත්තල් මත ඉදි කළ මෙ.වො. 200ක දැව්තෙල් බලාගාරයෙන් විදුලිය මිල දී ගැනීම ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයට නියෝග කිරීම.
iv. මිලදී ගැනීමේ ගිවිසුම් හා අදාල නිර්දේශ දින 7 ක් තුල ඉදිරිපත් කරන ලෙස තාක්ෂණ ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩල සාකච්ඡා සම්මුති කමිටුවට නියෝග කිරීම.

මේ සම්බන්ධයෙන් පහත කරුණු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනාවරණය කරන ලදී.

- පසු ගිය වසර වල දී විදුලිය කප්පාදු නොකළ නමුදු 2019 වසරේ මාර්තු වන විට විදුලිය කප්පාදුවක් සිදු වීම.
- මෙය වලක්වා ගැනීමට උත්සාහ කළ ද ඉටු කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් විකල්ප ක්‍රම මගින් විදුලිබලය ලබා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් මගින් ටෙන්ඩර කැඳවීමක් සිදු කිරීම.
- මෙම විදුලි ඒකකයක් සඳහා ගෙවනු ලබන මුදල දැනට ලංකාවේ විදුලි බලාගාරවල විදුලි ඒකකයක් සඳහා වැය වන මුදලට වඩා අඩු මුදලක් විය යුතු බවටත්, වෙසක් මාසයට විදුලිය ලබා ගත හැකි වන පරිදි මාස 2 ක් ඇතුලත සම්බන්ධතාවය ලබා දිය යුතු බවටත් වූ කොන්දේසි 2 ක් ඇතුළත් කිරීම.
- මෙම තුර්කි සමාගම විදුලිය ඒකකයක් රු. 24/85ට ලබා දීමට යෝජනා කිරීම අනුව මෙය ලංකාවේ මිලදී ගන්නා විදුලි ඒකකයක මිලට වඩා අඩු වීම.
- ඒ අනුව, විදුලිබල මණ්ඩලයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් මෙය අනුමත කිරීම.
- මෙය ඒක පාර්ශ්වීය යෝජනාවක් සහ මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබීම.
- මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් මෙය ප්‍රතික්ෂේප කිරීම සහ වර්ෂාව ලැබීම හේතුවෙන් විදුලිය කප්පාදු කිරීමට සිදු නොවීම.

එසේම මෙම **plant** එක පිලිබඳ යෝජනාව, පුවත්පත් දැන්වීමට ප්‍රතිචාරයක් ලෙස ලැබුනු යෝජනාවක් නොවන බවත්, මෙය ඒක පාර්ශ්විකව අමාත්‍යාංශයට ලබා දුන් යෝජනාවක් බවත්, ටෙන්ඩර කැඳවීම මගින් ලැබුනු යෝජනා **EOI (Expression of Interest)** ලෙස හඳුන්වනු ලබන බවත්, එහි තිබෙන තාක්ෂණය ලබා දෙන්නේ කවුරුන් විසින් ද යන්න පිළිබඳව හඳුනා ගැනීම මෙහි මූලික අදහස වූ බව හා මේ සඳහා ප්‍රතිචාර 16ක් පමණ ලැබුනු බවත්, ඒවා ඇගයීම **(evaluate)** කරන ලද නමුදු ඒ අතරේ මෙම යෝජනාව නොතිබුණ බවත් අතිරේක සාමාන්‍යාධිකාරි (සම්ප්‍රේෂණ) පැවසීය.

<u>**නිර්දේශ**</u>

i. පුවත්පත් දැන්වීමට අනුව තුර්කි තානාපතිවරයා විසින් මෙම විකල්ප ක්‍රමය හා සමාගම පිළිබඳව දන්වමින් 2019/04/11 දින එවා ඇති ලිපිය කාරක සභාවට ලබා දෙන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට නිර්දේශ කිරීම.
ii. තුර්කි තානාපති කාර්යාලයෙන් මේ පිළිබඳව ඉදිරිපත් කරන ලද යෝජනාව සහ ඒ සම්බන්ධයෙන් පෙබරවාරි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමෙහි කාර්ය සටහන් ලබා දීම.

iii. මේ සම්බන්ධව පවතින තාක්ෂණික සහ අනෙකුත් ගැටලු පිළිබඳව වන වාර්තා ද, නීතිපතිතුමාගේ මතය ද මේ සම්බන්ධයෙන් මහජන උපයෝගීතා කොමිෂන් සභාව ඉදිරිපත් කර තිබෙන වාර්තාව ද කාරක සභාව වෙත ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මෙම කරුණ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යංශ ලේකම්ගේ ලිපි අංක PE/TEN/SCAPC/SR/2019/33 හා 2019.10.18 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

07. <u>‘E-Scale’ වැටුප් ක්‍රමය</u>

‘E-Scale’ වැටුප් ක්‍රමය අනුව වැටුප් සැකසීම සම්බන්ධයෙන් වූ නඩු තීන්දුව හා මේ වන විට පවතින තත්ත්වය පිළිබඳ කරුණු විමසීම.

මෙම **‘E-Scale’** වැටුප් ක්‍රමය වැරදි බවට නඩු තීන්දුවේ සඳහන් නොවන බවත්, මෙය ලබා ගන්නා ලද ක්‍රමවේදය **(procedure)** වැරදි බවට සඳහන් වන බවත්. ඒ සඳහා මණ්ඩලීය අනුමැතිය ලබා ගත්ත ද ඉතිරි අනුමැතීන් ලබා ගෙන නොමැති බවත් 2018 වසරේ දී සාමූහික ගිවිසුම අත්සන් කරන විට දී කැබිනට් අනුමැතිය ලබා ලබා ගත් බවත්, නීතිපතිවරයාගේ මතය අනුව කැබිනට් අනුමැතිය ලබා ගනිමින් මෙය නිවැරදි කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට යොමු කර තිබෙන බවත් මේ සඳහා අදහස් දක්වමින් සාමාන්‍යාධිකාරී විසින් පැවසීය.

<u>නිර්දේශ</u>

අධිකරණ තීන්දුවත්, නීතිපති නිර්දේශයත්, අමාත්‍ය මණ්ඩල තීරණයත් එකිනෙකට අනුකූල ද යන්න පිළිබඳව සොයා බැලීම සඳහා විශේෂ විගණනයක් සිදු කරන ලෙස විගණකාධිපතිට නිර්දේශ කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව

(මුදල් අමාත්‍යාංශය)

(2019.12.10 දින සිට මෙම ආයතනය මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 සැප්තැම්බර් මස 04 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ක්‍රමවේදය

කාර්ය මණ්ඩලය තුළ කොන්ත්‍රාත් සහ අස්ථිර පදනමින් සිටින සේවකයන් විශාල සංඛ්‍යාවක් ඇති බව නිරීක්ෂණය වීම සහ බඳවා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් කරුණු විමසීම.

මෙහිදී ආයතනයේ සභාපති විසින් සඳහන් කරන ලද්දේ,

- මුදල් අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් විසින් එවනු ලබන ලේඛනයකට අනුව මෙම බඳවා ගැනීම් සිදු කරන බවත්,
- 2008 වර්ෂයේ සිට බැංකු සහකාර සහ කාර්යාල සහායක ශ්‍රේණි සඳහා බඳවා ගැනීම් කර ඇත්තේ මෙම ක්‍රමවේදයට අනුව බවත්,
- 2017 වර්ෂයේ සිට පුහුණු වැඩසටහන් සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කරනු ලැබු බවත් පුහුණු වීමේ කාලයට අදාලව පත්වීම් ලිපියක් නිකුත් කරන බවත්,
- මේ දක්වා මේ ආකාරයට පත්වීම් 250ක් පමණ ලබා දී ඇති බවත්,
- අනෙකුත් බැංකුවල බඳවා ගැනීමේ නිසි ක්රමවේදයක් තිබියදී මේ ආකාරයට දේශපාලන නිර්දේශ මත පත්වීම් ලබා දීම යෝග්‍ය නොවන බවත්,
- ඒ නිසා විධිමත් බඳවා ගැනීම් ක්‍රමවේදයක් සකස් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ඉහළ කළමනාකාරීත්වයේ වගකීමක් බැවින් එවැනි ක්‍රමවේදයක් ඉතා ඉක්මණින් සකස් කරන බව බවත් ය.

නිර්දේශ

i. මේ මගින් ශ්‍රී ලංකාවේ රැකියා වෙළෙඳපොලේ රැකියා අපේක්ෂා කරන සමස්ත ජනතාවටම බලවත් අසාධාරණයක් වන බව පෙන්වා දුන් කාරක සභාව, මාස 2ක් ඇතුළත නිසි බඳවා ගැනීමේ ක්‍රමවේදයන් සකස් කර විධිමත් අනුමැතියක් ලබා ගන්නා තෙක් (දැනට බඳවා ගෙන ඇති අය හැර) නව බඳවා ගැනීම් නතර කරන ලෙස නිර්දේශ කිරීම.

ii. නව ක්‍රමවේදය සකස් කොට එහි පිටපත් පහත සඳහන් ආයතනවලට යැවීම.

- මුදල් අමාත්‍යාංශය
- විගණකාධිපති
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මෙම බඳවා ගැනීම් සම්බන්ධව සිදුවන ක්‍රියාවලියට අදාළ තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

02. <u>නව ඉදිකිරීම්</u>

රු. මිලියන 77.28ක් වූ මහල් 18කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා වැය කළ රු.මිලියන 35.23ක ප්‍රාග්ධන වියදමක් ඇතුළත් වූ අතර, මෙම ගොඩනැගිල්ල වෙනත් ඉඩමක ඉදිකිරීමේ කළමනාකරණ තීරණය හේතුවෙන් 2016 දෙසැම්බර් 31 වන දින වන විට ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව එහි වර්තමාන තත්ත්වය පිළිබඳ කරුණු විමසීම.

මෙම කරුණ සම්බන්ධව ආයතනයේ සභාපති විසින් පහත අදහස් දක්වන ලදී.

- ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ 2008 වර්ෂයේ නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් සකස් කිර තිබූ බව.
- ඒ සඳහා **CECB** ආයතනයේ උපදේශන සේවාව ලබා දී තිබූ බව.
- නමුත් එවකට පැවති ආරක්ෂක තත්ත්වය මත ඉදිකිරීම් නතර කළ බව,
- ඒ වන විට රු. මිලියන 35ක් එම ආයතනයට ගෙවා තිබූ බව.
- මූලික ගෙවීම් කරන අවධියේ එම ප්‍රදේශය අධි ආරක්ෂක කලාපයක් ලෙස ප්‍රකාශ කොට නොතිබුණු බව හා පසුව එම ප්‍රදේශය අධි ආරක්ෂිත කලාපයක් ලෙසට ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල වෙනත් ඉඩමක ඉදිකිරීමට තීරණය කළ බව.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

CECB ආයතනය වෙත උපදේශනය සඳහා ගෙවනු ලැබූ මුදල්, එම ආයතනය සමග ඉදිරියේදී සිදු කරනු ලබන සේවා සම්බන්ධයෙන් කිරීමට සිදු වන සේවා ගාස්තු වලින් අඩු කර ගැනීමට කටයුතු කරන බව ජාතික ඉතිරිකිරීම් බැංකු සභාපතිගේ 2019.11.05 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත දන්වා ඇත.

03. වංචනික ක්‍රියා නිසා අයවිය යුතු ශේෂය

විවිධ වංචනික ක්‍රියා හේතුවෙන් රු. මිලියන 95.5ක මුදලක් බැංකුවට ලැබිය යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එය පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 1.2 ක් හෙවත් සියයට 1.27 ක වැඩි වී තිබුණි. මෙයින් රු. මිලියන 95ක මුදලක් වසරකට වැඩි කාලයක් ලැබිය යුතුව තිබුණු අතර රු. මිලියන 8.8ක මුදලක් වසර පහක් තිස්සේ ලැබිය යුතුව තිබුණි. එසේම 2018.12.31 වන දිනට වංචනික ක්‍රියා හේතුවෙන් අයවිය යුතු ශේෂය රු.මිලියන 110.5ක් වීම පිළිබඳව හා මෙම වංචනික ක්‍රියා මොනවාද යන්න විමසීම.

වංචනික ක්‍රියා යනු බැංකු නිලධාරීන් සහ පිටස්තර පුද්ගලයන් විසින් කරනු ලබන වංචා මෙලෙස වාර්තා වී ඇති බව හා සමහර වංචනික ක්‍රියා සඳහා රක්ෂණ ආවරණය ලැබී ඇති බවත්, සමහර වංචාවන් එසේ ආවරණය නොවන බවත් 2018.12.31 දින වන විට ලැබිය යුතු ශේෂය රු. මිලියන 110.5ක් දක්වා වැඩි වීමට ප්‍රධාන හේතුව වන්නේ ප්‍රධාන කාර්යාලයේ සිදුවූ රු.මිලියන 25ක වංචාව නිසා බවත් ඊට අදාල වගකිවයුතු නිලධාරින්ට එරෙහිව නීතිමය පියවර ගත් බවත් සභාපති විසින් පැවසූ අතර වංචා අවම කර ගැනිමට පහත සඳහන් පියවර ගෙන ඇති බව ඔහු විසින් තවදුරටත් පවසන ලදී.

1. විගණන අංශය ශක්තිමත් කිරීම
2. ප්‍රාදේශිය කාර්යාලවල කටයුතු නිරන්තර පරික්ෂණයට ලක් කිරීම

නිර්දේශ

පසුගිය වසර 2-3 කාලය තුළ සිදුවූ මෙවැනි සිදුවීම් වාර්තාවකට ගෙන එකින් එක සිදු වූ ආකාරය හා එයට සම්බන්ධ නිලධාරින් පිළිබඳ පරීක්ෂණ කිරීමට පියවර ගැනීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මේ සඳහා පහත ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇති බවට ආයතනය විසින් කාරක සභාව දැනුවත් කර ඇත.

- වංචාකරුවන්ට විරුද්ධව දැඩි නීත්‍යානුකූල පියවර ගන්නා අතර ම විගණන කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
- Wristle Blower ප්‍රතිපත්තිය සැකසීම.
- ප්‍රාදේශීය කළමනාකරුවන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ගේ දැඩි අවධානය යොමු කිරීමට කටයුතු කිරීම.
- සේවක ආකල්ප වෙනස් කිරීමට කටයුතු කිරීම.

04. <u>නිත්‍යානුකූල අයිතිය නොමැති ඉඩම් වල ගොඩනැගිලි ඉදිකිරීම</u>

ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය බැංකුවට ලබා නොගෙන ඉඩම් 8ක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බැංකුව විසින් රු. මිලියන 83.6ක මුදලක් වියදම් කර ඇති බව නිරීක්ෂණය විම.

මෙම සියලුම ඉඩම් රජය සතු වන අතර සමහර ඉඩම්වල නිත්‍යානුකූල ඔප්පු නොමැ බවත්, එක් ඉඩමක් පමණක් කතරගම දේවාලය සතු බවත් සභාපති පැවසීය.

<u>නිර්දේශ</u>

ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කොට මෙම ප්‍රශ්නය විසඳා ගැනීමට පියවර ගැනීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මෙකී ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීම සඳහා දැනටමත් කටයුතු කරමින් බවතින බව කාරක සභාව වෙත දැනුම් දී ඇත.

05. <u>ජාත්‍යන්තර බැඳුම්කර</u>

2012 දෙසැම්බර් 19 දින අමාත්‍ය මණ්ඩලය ගත් තීරණයට අනුව, ඇ.ඩො. මිලියන 1,000ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරිමට සහ ණය ආපසු ගෙවීමට හැකියාව ඇති රාජ්‍ය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යවසායන් සඳහා මෙම අරමුදල් ණයට දීමට අනුමැතිය ලබා දී ඇති බවත්, ඒ අනුව බැංකුව 2013 වසරේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 750ක් සහ 2014 වර්ෂයේදී ඇ.ඩො. මිලියන 250ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර පිළිවෙලින් 8.875% ක් සහ 5.15% ක පොළී අනුපාතයක් යටතේ නිකුත් කර තිබූ බව නිරික්ෂණය කිරිම සහ ඒ සම්බන්ධයෙන් කරුණු විමසීම.

ණය මුදලින් ඇ.ඩො. මිලියන 250ක් පියවීමට ඇති බවත්, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ලබා දුන් ණය මුදල වන ඇ.ඩො. මිලියන 177 ඇතුලුව බැංකුවට ලැබිය යුතු සියලුම මුදල් රජය විසින් ලබා දී ඇති බවත් මෙහිදී සභාපති විසින් පැවසීය.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ඉහත පියවීමට ඇති ඇ.ඩො. මිලියන 250ක ණය මුදල, ඊට අදාළ පොලී මුදල් ද සමඟ 2019.09.11 වන දින නිසි පරිදි ගෙවා අවසන් කර ඇති බව කාරක සභාවට දැනුම් දී ඇත.

<u>මහජන බැංකුව</u>

<u>(මුදල් අමාත්‍යාංශය)</u>

(2019.12.10 දින සිට මෙම ආයතනය මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 සැප්තැම්බර් මස 05 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. <u>අක්‍රිය ණය</u>

මෙම කරුණ සම්බන්ධ පහත කරුණු පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

- 2016 වසර හා සැසඳීමේ දී 2018 වසර වන විට අක්‍රිය ණය ප්‍රමාණය විශාල වශයෙන් වැඩි වී තිබීම.
- 2018 වසරේ දී කපා හරින ලද ප්‍රාග්ධනය සහ අත හැර දැමූ පොලිය රු.මිලියන 895.91ක් වීම.
- 2019 වසරේ මුල් මාස 7 තුල අක්‍රිය ණය සඳහා අලුතෙන් රු.මිලියන 6294ක ප්‍රමාණයක් එකතු වීම.
- පසුගිය මාස 31 තුල රු. මිලියන 20,428 ප්‍රමාණයකින් අක්‍රිය ණය කළඹ වැඩි වී තිබීම.
- අක්‍රිය ණය සහ අයිරා ඉහළම ගනුදෙනුකරුවන් දස දෙනාගේ ප්‍රාග්ධන සහ පොලිය 2016.08.20 දිනට ශේෂය රු.මිලියන 37,727ක් වීම.

මෙහිදී සාමාන්‍යාධිකාරී විසින් පහත කරුණු ඉදිරිපත් කරන ලදී.

i. බැංකු ක්ෂේත්‍රයේ සහ ආර්ථිකයේ ඇති වී තිබෙන ගැටලු හේතුවෙන් ගනුදෙනුකරුවන්ට ණය ගෙවීමේ අපහසුතාවයක් මතු වී තිබෙන බව.
ii. අක්‍රිය ණය ලැයිස්තුවේ ඉහලම ගනුදෙනුකරුවන් දස දෙනා අතර සිටින සී.එම්.එල්. සමාගමෙන් අය වීමට තිබෙන මුදල අය කර ගැනීමට හැකි බව.
iii. යශෝධා ව්‍යාපාරයට ලබා දී තිබෙන ණය අය කර ගැනීමට ඔවුන් සතුව දේපල නොමැති බව හා මුදල් අය කර ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතින බව.
iv. අක්‍රිය ණය ප්‍රමාණය වැඩි නොවීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතින බව.
v. ණය ලබා දීමේ දී විවිධ කරුණු සැලකිල්ලට භාජනය කරමින් ණය ලබා දීම සිදු කරනු ලබන බව.

02. <u>පාසැල් හැර ගිය පුද්ගලයන් බඳවා ගැනීම</u>

පාසැල් හැර ගිය පුද්ගලයන් 1800ක් බඳවා ගන්නා ලෙස දන්වමින් **"therefore, please make arrangements to recruit 1800 school leavers with the required qualifications as Office Assistants until a permanent arrangement is made"** ලෙස සඳහන් කරමින් එවා තිබෙන 2019/05/15 දිනැති ලිපිය පිළිබඳ කරුණු විමසීම.

මෙහිදී අනාවරණය වූයේ, මාස 6 ක කාල සීමාවක් සඳහා පුහුණුවන්නන් ලෙස මේ වන විට 80 දෙනෙකු බඳවා ගෙන තිබෙන බවත්, එම කාල සීමාව අවසන් වූ පසු පවතින ඇබෑර්තු අනුව ස්ථිර තනතුරු සඳහා බඳවා ගනු ලබන බවත්, මෙසේ බඳවා ගනු ලබන පුද්ගලයන් සඳහා ස්ථිර රැකියා ලබා දීම පිණිස කිසිදු එකඟතාවයක් නොමැති බවයි.

<u>නිර්දේශ</u>

i. රාජ්‍ය බැංකු මගින් තාවකාලිකව පුහුණු වීම් සඳහා බඳවා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කර එය කාරක සභාවට ඉදිරිපත් කිරිම.

ii. පුද්ගලයන් බඳවා ගැනීමේ දී ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු කාල සීමාව, තිබිය යුතු අවම සුදුසුකම්, යනාදිය සඳහන් කරමින් විවෘත දැන්වීමක් පල කිරීමට පියවර ගන්නා ලෙසට රාජ්‍ය බැංකු වෙත නිර්දේශයක් නිකුත් කිරීමට කටයුතු කරන මෙන් අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

වාර්තා කර නොමැත.

03. <u>හිටපු සාමාන්‍යාධිකාරි එන්. වසන්ත කුමාර් මහතාට මාස 6ක සේවා දිගුවක් ලබා දීම සහ විශ්‍රාම යාමෙන් පසු වාහන ලබා දීම</u>

(අ) මෙම නිලධාරියාට මාස 6ක සේවා දිගුවක් ලබා දීම සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කරන ලදී.

වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2018 ඔක්තෝබර් මස විශ්‍රාම යාමට නියමිතව සිටි එවකට මහජන බැංකුවේ සාමාන්‍යාධිකාරි ලෙස කටයුතු කළ එන්. වසන්ත කුමාර් මහතා හට මාස 6ක කාල සීමාවක් සඳහා සේවා දිගුවක් ලබා දීම සඳහා 2018 ජූලි 17 වැනි දින පවත්වන ලද කාරක සභාවේ දී කරන ලද ඉල්ලීම සලකා බලා අනෙකුත් රාජ්‍ය බැංකු සඳහා පූර්වාදර්ශයක් වන පරිදි පාර්ලිමේන්තුව වෙනුවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඒ සඳහා එකඟ විය නොහැකි බවට කාරක සභාවේ නිර්දේශය දන්වා කාරක සභාවේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා යවා තිබියදීත් එම නිර්දේශය උල්ලංඝනය කරමින් හිටපු සාමාන්‍යාධිකාරි, එන්. වසන්ත කුමාර්

මහතා හට මාස 6 ක සේවා දිගුව ලබා දීමෙන් මහජන බැංකුවට වූ පාඩුව රු. 15,410,266/-ක් බවට විගණකාධිපති විසින් ගණනය කර තිබෙන බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>**නිර්දේශ**</u>

i. පසුගිය කාරක සභාවේදී ද මෙම පැහැදිලි කිරීම සිදු කර තිබෙන බවත් පොදු ව්‍යාපාර කාරක සභාවේ දී ගනු ලැබූ තීරණය උල්ලංඝනය කර සේවා දිගුව ලබා දීම සහ එම අත්තනෝමතික තීරණය හේතුවෙන් මහජන බැංකුවට රු. 15,410,266/-ක් පාඩු සිදු කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම පිණිස මහජන බැංකුවේ හිටපු සභාපතිවරයෙකු වන හේමසිරි ප්‍රනාන්දු මහතා සහ භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවෙන් මෙම අනුමැතිය ලබා දුන් භාණ්ඩාගාරයේ එවකට අතිරේක ලේකම්, ආර්. සේමසිංහ මහතාත් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව ඉදිරියට කැඳවීමට පියවර ගැනීම.

ii. කාරක සභාව ලබා දුන් නියෝගයක් අනුව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාව සිය බලවත් අප්‍රසාදය පල කළ අතර සම්පූර්ණ ක්‍රියාවලියම නිත්‍යානුකූල නොවන බැවින් පහත සඳහන් පියවර ගැනීම.

a) වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීම.

b) වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභය අය කර ගැනීමට කටයුතු කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

i. ඉහත නිර්දේශ (i) අනුව මෙම නිලධාරීන් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද හා ආචාර ධර්ම පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීම සඳහා එම කාරක සභාවට දැනුම් දී ඇත.

ii. ඉහත නිර්දේශ (ii) අනුව මහජන බැංකු සභාපතිගේ 2019.11.19 දිනැති ලිපියෙන් දන්වා එවා ඇත්තේ මෙම සේවා දිගුව ලබා දී ඇත්තේ එවකට පැවැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් අනුව බව වන අතර ප්‍රගතිය වාර්තා කර නොමැත.

(ආ) <u>විශ්‍රාම යාමෙන් පසු වාහන ලබා දීම</u>

කාරක සභාව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කළාය.

i. රු. ලක්ෂ 166කට මිල දී ගන්නා ලද අංක **CIA** 4646 දරන වාහනය ශුද්ධ පොත් අගය වූ රු. 113,698/-ක මුදලකට නිදහස් කිරීමට ගෙන තිබෙන තීරණය.

ii. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 487/2019 අනුව හිටපු සාමාන්‍යාධිකාරි විසින් භාවිතා කරන ලද අංක **KM** 9238 දරන වාහනය බැංකුවට භාර දීමට නියමිතව තිබිය දී ඔහු සතුව තබා ගැනීම.

<u>නිර්දේශ</u>

i. නීති විරෝධී ලෙස රැගෙන ගොස් තිබෙන වාහන ආපසු බැංකුව වෙත ලබා ගැනීමට කටයුතු කිරීම.
ii. මෙම තීරණය නිසි ලෙස ක්‍රියාත්මක කොට සිදු වූ පාඩුව අය කර ගැනීමට අසමත් වුවහොත් ජාතික විගණන කොමිසම වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉදිරි පියවර ගන්නා ලෙස විගණකාධිපතිට නිර්දේශ කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

පහත තොරතුරු කාරක සභාව වෙත දැනුම් දී ඇත.

i. මුදා හැර තිබූ වාහන 2න් එකක් ආපසු ලබා ගෙන බැංකු පරිශ්‍රයේ රඳවා තිබෙන බව.
ii. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද වාහන ලබාදීමේ ප්‍රතිපත්තිය මත එක් වාහනයක් එන්. වසන්ත කුමාර මහතා වෙත මුදා හැර ඇති අතර විකුණුම් මිල තීරණය කළ යුතු බව.

04. <u>ඩිජිටල්කරණ ව්‍යාපෘතිය</u>

මෙම ඩිජිටල්කරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කාරක සභාව විසින් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කිරීම.

- ඇ.ඩො. මිලියන 11ක්වූ මෙම ව්‍යාපෘතිය සිල්වර්ලේක් සමාගමට ලබා දීම.
- එහි ප්‍රාග්ධන කොටස වන ඇ.ඩො. මිලියන 7.6න් 7.3ක් 2019/08/26 වන විට ගෙවා තිබීම.
- මොඩියුල් 7ක් සැපයිය යුතු වුව ද මොඩියුල් 2ක් සඳහා ආරම්භ කිරීමට පෙර ගෙවීම් සිදු කිරීම.
- ගිවිසුමේ එකඟ වූ මුදලට අමතරව මොඩියුල් වෙනස් කිරීම, දෘඩාංග මිල දී ගැනීම යනාදිය සඳහා අමතරව විශාල මුදලක් ගෙවා තිබීම.
- 2019/08/26 වන විට **Just in time technologies**, **Silverlake Sprint SDNBHD** සහ **Silverlake Digital Economy** යන ආයතන සඳහා එකතුව රු. මිලියන 452ක් අමතර ගෙවීම් කර තිබීම.
- මෙම අමතර ගෙවීම් සම්බන්ධයෙන් ඉන්වොයිස්, වවුචර, තොරතුරු ඉල්ලා සිටිය ද ඒ අතුරෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 149/2018 හරහා **Git** ආයතනයට ගෙවීම පිණිස එවන ලද රු. මිලියන 84ක් සඳහා වූ ඉන්වොයිසිය පමණක් තොරතුරු ලෙස විගණකාධිපති වෙත ලැබීම සහ ඒ හේතුවෙන් මෙම මුදල අදාල කාර්යය සඳහා පමණක් යොදා ගත්තේ ද යන්න පිළිබඳ තහවුරුවක් ලබා දීමට නොහැකි වීම.

නිර්දේශ

i. ඉහත සඳහන් රු. මිලියන 84ට අදාලව පහත සඳහන් විස්තරාත්මක තොරතුරු මාසයක් තුළ කාරක සභාවට එවන ලෙස විගණකාධිපතිට නිර්දේශ කිරීම.
   - මෙම ගෙවීම අනුමත කිරීම, සහතික කිරීම, තහවුරු කිරීම යනාදි කටයුතු සඳහා වගකිව යුතු නිලධාරින් පිළිබඳ විස්තර
   - ගෙවීම් සහතික කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම.

ii. දැනට සිදු කරමින් පවතින ව්‍යෝහාරික විගණනයෙන් අනාවරණය වන තොරතුරු පිළිබඳ වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීම.

iii. සිදු කරමින් පවතින මෙම ඩිජිටල්කරණ ක්‍රියාවලිය සහ ඒ සඳහා වන වියදමෙහි සාධාරණ භාවය පිළිබඳව විශේෂඥ මතයක් ලබා ගැනීම පිණිස තොරතුරු තාක්ෂණ කමිටුව විසින් දෙනු ලබන වාර්තාව අනුව මාස 6ක කාලයක දී මේ පිළිබඳව අවසන් තීරණයකට එළඹීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

i. ඉහත නිර්දේශ අංක (i)ට අදාළව තොරතුරු ඉදිරිපත් කර ඇත.

ii. ඉහත නිර්දේශ අංක (ii) හා (iii)ට අදාළව ප්‍රගතිය වාර්තා කර නොමැත.

05. මහජන බැංකු පනත සංශෝධනය කිරීම

මහජන බැංකු පනත සංශෝධනය කිරීමේ වූ යෝජනාව පිළිබඳ පසු ගිය කාරක සභාවේ දී ද සාකච්ඡා කරන ලද බවත් බැංකුවේ ප්‍රාග්ධනය රු. බිලියන 50 දක්වා වැඩි කිරීමටත් බැංකුව විසින් ණයකර නිකුත් කිරීම සඳහා වූ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන බවත් නිරීක්ෂණය වීම සහ මෙම ණයකර, කොටස් බවට පරිවර්තනය කිරීමේ හැකියාව පිළිබඳවත් විමසීම.

මෙහිදී අනාවරණය වූයේ,

- මෙම පනත් කෙටුම්පත මගින් මහජන බැංකු පනතෙහි 12, 20, 21 සහ 43 වගන්ති සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බවත්,
- මෙහි අරමුණු වනුයේ ලැයිස්තුගත ප්‍රාග්ධන සීමාව රු. බිලියන 1 සිට රු. බිලියන 50 දක්වා වැඩි කිරීම සහ ණයකර නිකුත් කිරීමේ නීතිමය හැකියාව ඇති කිරීම බවත්,
- බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස 1988 අංක 30 දරන බැංකු පනත යටතේ මහජන බැංකුව, මහ බැංකුවේ අධීක්ෂණය යටතට පත් වන බවත්,

- ඒ අනුව සියලු කටයතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබා ගත යුතු වන බවත්,
- 13 වැනි වගන්තිය කොටස් විකිණීම සම්බන්ධයෙන් අදාල වන බවත්,
- මෙම සංශෝධනයේ දී එම වගන්තිය සංශෝධනය නොවන බවත් ය.

06. <u>විශ්‍රාමික නිලධාරීන්ට වාහන ලබාදීමේ ප්‍රතිපත්තිය</u>

නිලධාරින්ට වාහන ලබා දීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කිරීම පිළිබඳ කරුණු විමසීම.

i. නව යෝජනා ක්‍රමය අනුව ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියකු විශ්‍රාම යාමට පෙර වසර 2ක සේවා කාලයක් පැවතිය යුතු වුව ද එම කොන්දේසිය සංශෝධනය කර සේවා කාලය වසර 2ක් සම්පූර්ණ නොකළ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරින් සඳහා ද ණය ලබා දීම.

ii. ආයතනික කළමනාකරණ සාමාජිකයකු, ප්‍රධාන විධායක නිලධාරියකු, ප්‍රධාන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු වසර 7කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් ඔවුන් භාවිත කරන ලද වාහනය කිසිදු අය කිරීමකින් තොරව එම නිලධාරියාටම ලබා දීම.

විශේෂිත අවස්ථාවන්හි දී බැංකුවට කර තිබෙන සේවය සලකා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙලෙස ණය ලබා දී තිබෙන බවත්, මෙවැනි පූර්වාදර්ශයක් ලංකා බැංකුවෙන් ද වාර්තා වන බවත්, ඒ අනුව ලංකා බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ශ්‍රේණියෙහි වසර 2ක් සේවය කර තිබෙන නිලධාරියකුට තමා භාවිතා කළ වාහනය, පොත් අගය පමණක් ගෙවා තමා සන්තක කර ගැනීමට ලබා දී තිබෙන පහසුකම සැලකිල්ලට ගනිමින් මහජන බැංකුව ද සේවා කාලය වසර 7ක් සම්පූර්ණ කළ නිලධාරින්ට එම පහසුකම ලබා දී තිබෙන බව මෙහිදී සභාපතිවරයා විසින් ප්‍රකාශ කරන ලදී.
තවද, වාහන ලබා දීම පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කර එය ඉදිරිපත් කරන ලෙසට පසු ගිය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඉල්ලීමක් කර තිබෙන බවත්, එහි වගකීම සාමාන්‍යාධිකාරිවරයා වෙත පවරා තිබෙන බවත්, මීළඟ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී එය ඉදිරිපත් කිරීමට නියමිත බවත් ඔහු විසින් තවදුරටත් පවසන ලදී.

<u>**නිර්දේශ**</u>

විශ්‍රාමික නිලධාරීන්ට වාහන ලබා දීම පිළිබඳ ක්‍රමවේදය අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කිරීමෙන් අනතුරුව කාරක සභාව වෙත ලබා දීමට කටයුතු කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

විශ්‍රාමික නිලධාරීන්ට වාහන ලබා දීමේ ප්‍රතිපත්තිය පිළිබඳ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 03)**

07. <u>රාජ්‍ය ආයතන සඳහා ලබා දී තිබෙන ණය</u>

රාජ්‍ය බැංකුවක් ලෙස රාජ්‍ය ආයතන කිහිපයක විශාල මුදල් ප්‍රවාහයක් පවතින ආයතනයක් ලෙස මෙම බැංකුව රටේ ජනතාවගේ තැන්පතු මුදල් සහ රජයේ ණයට වගකිව යුතු බවත්, පෞද්ගලික අංශය සමග තරඟ කළ යුතු බවත් බැංකුවේ අභ්‍යන්තර පාලනය, විනිවිද භාවය, තීන්දු සහ තීරණ ගැනීම යනාදී කරුණු සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ බැංකුවල මෙතරම් දුර්වලතාවයක් නොදක්වන බවත්, මෙහි පවතින කළමනාකරණ ගැටලු විසඳා ගත යුතු බවත් කාරක සභාව විසින් පෙන්වා දීම.

<u>නිර්දේශ</u>

ලංකා විදුලිබල මණ්ඩලය, තෙල් සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය, ජල සම්පාදන මණ්ඩලය වැනි ආයතන සඳහා බැංකුවෙන් ලබා දී තිබෙන ණය ප්‍රමාණය සහ ඔවුන්ගෙන් අය වීමට තිබෙන ණය ප්‍රමාණය පිළිබඳව තොරතුරු කාරක සභාව වෙත ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

අදාළ වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 04)**

ඇමුණුම 03

Loans & Advances granted to State Owned Enterprises *Annexure 01*

Name of the Institution	As at 31.10.2019	
	Loans Granted (Rs.)	Amount Outstanding (Rs.)
Deputy Secretary to Treasury (DST) - OD / Loan	232,365,805,080.04	187,710,432,250.28
Ceylon Petroleum Corporation (CPC)	157,609,387,900.00	147,133,235,654.43
Ceylon Electricity Board (CEB) (OD / Loan)	84,105,709,249.38	59,458,940,351.40
Sri Lankan Airlines	31,468,000,000.00	31,468,000,000.00
Road Development Authority	39,268,709,632.31	30,628,477,064.85
Director Pensions	31,862,477,308.33	26,721,237,763.95
Ceylon Shipping Corporation	14,494,400,000.00	12,467,079,925.50
National Water Supply & Drainage Board	14,013,877,668.71	12,269,724,859.42
Ceylon Fertilizer Corporation	56,297,805,378.10	13,209,478,453.38
Urban Development Authority	9,000,000,000.00	8,754,806,550.68
Colombo Commercial Fertilizer	29,966,558,429.71	7,677,456,771.01
Sri Lanka Telecom	7,000,000,000.00	7,000,000,000.00
Cooperative wholesale Establishment (CWE)	5,831,031,973.23	5,765,181,973.23
Sri Lanka Ports Authority	3,950,858,869.57	3,950,858,869.57
Paddy Marketing Board	4,705,000,000.00	2,846,712,121.62
Mihin Lanka	2,555,900,000.00	2,555,900,000.00
State Pharmaceutical Corporation	2,051,939,420.00	2,044,327,659.29
Lanka Sathosa	1,841,304,000.00	1,815,248,627.76
State Printing Corporation	1,021,817,343.55	967,907,842.65
National Housing Development	2,882,053,500.00	935,743,155.82
Ministry of Defence	1,163,962,830.12	829,200,320.43
Sri Lanka State Trading	847,105,999.62	737,173,880.38
Sri Lanka Central Transport Board	694,182,780.00	690,326,778.97
State Engineering Corporation	171,800,000.00	407,924,825.11
National Livestock Development Board	367,285,000.00	194,145,369.43
MILCO	189,500,000.00	185,179,598.34
Lanka Building Materials Corporation	163,500,000.00	146,625,682.44
The Associated Newspapers of Ceylon	265,000,000.00	135,774,314.15
Sri Lanka Tea Board	500,000,000.00	125,051,206.48

ඇමුණුම 04

Board Meeting held on 30.09.2019.

Transport Policy for the Members of the Corporate Management-B P No. 723/2019

The Board of Directors discussed and stipulated the following procedure as the policy in the disposal of the vehicles for Members of the Corporate Management.

1. **Minimum Service requirement**

   a. A Corporate Management Member should have at least a period of 25 years confirmed service to be eligible under this procedure to purchase the vehicle he/she used when they were in service

2. **Purchase Value**

   a. Purchase price of the vehicle will be determined on the basis of two factors i.e combination of CIF value and Depreciated value of the vehicle
   b. A percentage of CIF value is derived from the number of years of service as Corporate Management Member – (Minimum Two years required)
   c. The vehicle will be depreciated over a period of four years

   d. Purchase value will be calculated in the following manner

CIF Value		Depreciated Value		
7 years = 5% of CIF 6 years = 6% of CIF 5 years = 7% of CIF 4 years = 8% of CIF 3 years = 9 % of CIF 2 years = 10% of CIF	+	5 %	⇒	Purchase Value

Example.
An Employee who has 30 years confirmed service in the Bank was appointed as DGM in October 2017 has two years service as Corporate Management Member.

CIF value of a Vehicle purchased in October 2017 is Rs. 15 Mn. Purchase value of the vehicle is Rs. 25 Mn. in 2017.

DGM may buy the vehicle he used for Rs. 2.125Mn. (10% CIF 15 = Rs.1.5Mn + 5% of depreciated value of Rs.12.5Mn.= Rs.625,000) at the time of his retirement in October 2019.

e. The vehicle available for purchase should be at least over one year from the date of purchase by the Bank. if not the Corporate member should pay 50% of the Purchase value of the vehicle purchased by the Bank (if purchase date is less than one year from the date of retirement.)

f. CEO/General Manager may purchase the vehicle he used by paying of 5% of the CIF value at retirement subject to 1 (a), 2 (e) and 3 (b) .

3. Other Conditions

a. Service periods covered as Acting DGM/Head will not be counted for service as Corporate Management Member

b. This option can be availed by the Corporate Member once only at retirement from service

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

(ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යංශය)

(2019.12.10 දින සිට මෙම ආයතනය කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යංශය විෂය පථය යටතට අයත් වේ)

විමර්ශනය කරන ලද දිනය : 2019 ජූලි මස 10 වන දින

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. ආයතනයේ කාර්යභාරය විමසීම

සමාජ ආරක්ෂණ ප්‍රත්පත්ති සම්පාදනය යටතේ ආයතනය මගින් කරනු ලබන කාර්යභාරය, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම, රාජ්‍ය හා රාජ්‍ය නොවන අනෙකුත් ආයතන සමඟ ඇති සම්බන්ධතාවය සහ උපායමාර්ගික වශයෙන් ආයතනය මගින් සිදු කර ඇති කාර්යභාරය පිළිබඳ විමසීම.

මෙහිදී අදහස් දක්වමින් ආයතනයේ සභාපති විසින් ප්‍රකාශ කරන ලද්දේ, ස්වයං රැකියාලාභීන් සඳහා රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම, රජයේ විශ්‍රාම වැටුපක් නොමැති අයට විශ්‍රාම වැටුපක් නිර්මාණය කිරීම ආදිය මෙහි ප්‍රධාන කාර්යයන් වන අතර මේ යටතේ ධීවර හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන් ආවරණය නොවන බවත් පවතින අඩුපාඩු ඉවත් කරගෙන ජනතාවට වඩාත් ඵලදායී සේවාවක් ලබා දීම සඳහා පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බවත් ය.

තවද ඔහු විසින් වැඩිදුරටත් සඳහන් කරන ලද්දේ, ආරම්භයේ දී ක්‍රියාත්මක වූයේ ග්‍රාම නිලධාරීන් හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් කේන්ද්‍ර කරගෙන වුවත් මෙම ක්‍රියාවලිය වෙනස් කර දැනට ක්‍රියාත්මක කරනුයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍ර කරගෙන බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 යටතේ එකකට 10දෙනා බැගින් 3310 දැනට පත් කරමින් සිටින බවත්, මේ වන විට සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් නිදහස් ජාලයක් (Independent Network) පවත්වාගෙන යන අතර පත් කර ඇති 10දෙනාට බඳවා ගන්නා සාමාජිකයින් ප්‍රමාණය අනුව කොමිස් මුදලක් ලබා දීමට ක්‍රියා කරන බවත් ය.

02. පරිගණක පද්ධතිය මගින් ආයතනය බලාපොරොත්තු වූ අරමුණ ඉටු නොවීම

2019 අගෝස්තු වන විට මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය සැපයුම් කට්ටල 05කින් සමන්විතව ආයතනයට භාර දීමට සැළසුම් කර තිබුණ ද, පළමු සැපයුම් කට්ටලය 2018 දෙසැම්බර් 14 දිනටද, දෙවන සැපයුම් කට්ටලය 2019 පෙබරවාරි 08 දින සහ තෙවන සැපයුම් කට්ටලය 2019 අප්‍රේල් 10 දින ලබා දීමත් ඒ අනුව අදාළ සැපයුම්කරු වෙත ගෙවීම සහ පද්ධතිය අධ්‍යයන

කිරීම අවසන් කළ යුතුව තිබුණද පළමු සැපයුම් කට්ටලය 2018 දෙසැම්බර් 24 දින භාර දී ඒ සඳහා 2019 පෙබරවාරි රු. 1,090,250/-ක් ගෙවීම් කර තිබුණු නමුත් 2019 ජූලි 01 වන දිනය වන විටත් දෙවන සහ තෙවන සැපයුම් කට්ටල ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබීම.

2019 ඔක්තෝබර් 31 වන දින විට සැපයුම් කට්ටල සියල්ල ස්ථාපිත කර නව පරිගණක දත්ත පද්ධතියේ ගැටලු සියල්ල අවසන් කරන බවට සභාපති විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

03. <u>ආයතනයේ පුරප්පාඩු නොපිරවීම</u>

2019 මැයි 02 දින වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරගත් සාමාන්‍යාධිකාරී තනතුර ද ඇතුළත්ව ආයතනයේ තනතුරු 07ක් පුරප්පාඩු වී පැවතීම.

තවද, සාමාන්‍යාධිකාරී තනතුර සඳහා 2018.09.25 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අයදුම්කරුවකු බඳවා ගැනීමට නිර්දේශ කර තිබුනද එම නිලධාරියාව බඳවා නොගෙන නැවත එම තනතුර සඳහා අයදුම්පත් කැඳවමින් පුවත්පත්වල දැන්වීමක් පළ කිරීම ගැන කාරක සභාවේ අවධානය යොමු විය.

<u>**නිර්දේශ**</u>

i. මේ පිළිබඳ අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් සිදු කර ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් කාරක සභාව සහ විගණකාධිපති වෙත මසක කාලයක් ඇතුලත ලබා දීම.

ii. මේ සම්බන්ධයෙන් පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තීරණ සඳහන් කාර්ය සටහන් සියල්ල කාරක සභාව සහ විගණකාධිපති වෙත මසක කාලයක් ඇතුලත ලබාදීම. (2019.03.28 දින 243 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ කාර්ය සටහන ද ඇතුළත්ව)

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

මේ සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් සිදු කළ පරීක්ෂණ වාර්තාව, සමාජ ආරක්ෂණ රාජ්‍ය ලේකම්ගේ අංක MPI&IAU/02/2(I) හා 2019.12.13 දිනැති ලිපියෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

04. <u>ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යැමට කුලියට ගත් ගොඩනැගිල්ල</u>

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ල ගිවිසුම් කාලය අවසන් වීමට පෙර වෙනත් කුලී

ගොඩනැගිල්ලකට ගෙන යාම නිසා රජයට රු.5,090,906/-ක මූල්‍ය අලාභයක් සිදුවීම.

නිර්දේශ

මෙම ක්‍රියාවලියට අදාල සවිස්තර වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට ලබාදීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

අදාළ කුලී ගිවිසුම අවසන් කිරීම සම්බන්ධ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති නමුදු නිර්දේශිත වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කර නොමැත.

05. කලාකරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

මණ්ඩලය විසින් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමග කලාකරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට 2017 අගෝස්තු 28 දින අවබෝධතා ගිවිසුමකට අත්සන් කර ආරම්භක ප්‍රාග්ධනය ලෙස රු. මිලියන 94ක් 2017 දෙසැම්බර් 31 දින වන විට අවස්ථා දෙකකදී මණ්ඩලය වෙත ලැබී තිබීම හා 2019 අප්‍රේල් 31 දින වන විට ඒ සඳහා කලාකරුවන් 127දෙනෙකු තෝරා ගෙන තිබීම.

නිර්දේශ

i. මෙම ක්‍රියාවලිය විධිමත් ක්‍රියාත්මක කිරීමට සියලු කටයුතු ඉතා ඉක්මනින් සිදු කරන බවට අමාත්‍යංශ ලේකම් කාරක සභාවට ප්‍රකාශ කරන ලදී.
ii. මේ සඳහා වැඩ පිළිවෙලක් සකසා මාස 6ක කාල සීමාවක් තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මේ සම්බන්ධව විධිමත් වැඩපිළිවෙලක් ආරම්භ කර ඇති බව කාරක සභාව වෙත දැනුම් දී ඇත.